# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.03.17

වර්ෂ 2020 ක් වූ මාර්තු මස 17 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මාර්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි**

01. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>

<u>01) 2020-02-10 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-02-10 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-02-10 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2020-02-10 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

2020.02.10 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02) 2020-02-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-02-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-02-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** 2020-02-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සංශෝධන ඉදිරිපත් කිරීමට දෙනු ලැබූ අවස්ථාවේ සඳහන් කළ යුතු කාරණයක් තියෙනවා 21 පිටුවේ. ගරු මන්ත්‍රී ඩබ්. එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා යටතේ එතුමා විසින් යෝජනා කරනු ලැබුවා අංක 22 යෝජනාව යටතේ "ගාල්ල, කලේගාන, නාගරුක්ඛාරාම මාවතේ යන ලිපිනයේ පදිංචි පී. එච්. හර්ෂ ප්‍රමෝදය යන අය කම්කරුවෙකු වශයෙන් බඳවා ගැනීමට යෝජනා කරමි" කියලා. එතුමා විසින් ඉදිරිපත් කරන ලද නම් කීපයම, යෝජනා කරන ලද නම් කීපයටම අදාළව සේවක මහතෙකු බඳවා ගැනීමට නොහැකි වූ නිසා මම ඒ අවස්ථාවේදී කියා සිටියා මෙම යෝජිත නම සඳහා සේවක මහතෙකු ඉදිරිපත් කිරීමට නොහැකි වුණොත් එම අවස්ථාව ආසන්න කොට්ඨාශයේ මන්ත්‍රීවරයා හැටියට මට ලබා දෙන්න කියලා. ඒක මේ වාර්තාවේ සඳහන් වෙලා නෑ.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කොට්ඨාශයේ තවත් එහෙම ඉදිරිපත් වෙන්න පුලුවන් අය ඉන්නවා ඕන තරම්. මේ කලේගාන කොට්ඨාශයේ වටරැක ප්‍රදේශයට ඔබතුමා අවස්ථාවක් දුන්නෙම නෑ. ඒ පැත්තේ ඕන තරම් කම්කරුවෝ වශයෙන් එන්න අය ඉන්නවා. ඒක කොට්ඨාශයට කරන ලොකු අසාධාරණයක් එහෙම වුණොත්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මම කිවුවේ මම සඳහන් කරපු දේ වාර්තාවේ ඇතුලත් වෙලා නෑ කියලා. එච්චරයි මම කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක විලිලැජ්ජයි කතා කරන්න. දැන් සේවකයෝ කවුද කියලා දාලා ගෙනැල්ලා මේවා කරගන්නවා මිසක්, මේ කොට්ඨාශයෙන් මෙයා දානවා, මේ කොට්ඨාශයෙන් මෙයා දානවා කියන ඒවා සභාවක කතා කළ යුතු දේවල්ද කියලා හිතෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් ඇත්තටම ඒ පිළිබඳව කණගාටු වෙනවා. ඒ ගැන මම වැඩිදුර අදහස් මේ වෙලාවේ දක්වන්න බලාපොරොත්තු වෙන්නේ නෑ රැස්වීමේ වැඩ කටයුතු ඉක්මනට අවසන් කරන්න අවශ්‍ය නිසා. මම සතුටු වෙනවා මගේ කොට්ඨාශයේ නමක් යෝජනා වීම පිළිබඳව. මම සතුටු වෙනවා ඒකෙදි. ඒක හැබැයි මම කියලා ඉදිරිපත් කරපු එකක් නෙමෙයි කියලා මම මේ අවස්ථාවේදී කියන්න ඕන.

2020.02.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමන්ලා දන්නවා වර්තමානයේ රටේ උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳව හා ලෝකය පුරාවට උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳව. ඒක ගැන සියලු දෙනා දැනුවත්. අද මාර්තු මාසයේ මහා සභා රැස්වීම තියෙනවා කියලා න්‍යාය පත්‍රය යවලා ඔබතුමන්ලාට දැනුම් දීලා තියෙන නිසා අද ඒ අනුව රැස්වීම පවත්වන්නයි අපි බලාපොරොත්තු වන්නේ. ඉතිං මම ඉතාමත්ම ගෞරවයෙන් සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා අදාළ කරුණු පමණක් සාකච්ඡා කරලා න්‍යාය පත්‍රයට අනුව හැකි ඉක්මනට අපි මහා සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරමු. න්‍යායපත්‍රානුකූලව වැඩ කරමු කියන ඉල්ලීම සියලුම මහජන නියෝජිතයින්ගෙන් මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ඒ වගේම නිවාඩු දිනයක් වෙලත් මේ රැස්වීම සාර්ථක කර ගන්න ලේකම්තුමා, රමේෂ් මහත්තයා ප්‍රධාන නිලධාරීන් කිහිප දෙනෙක් දක්වන සහයෝගය පිළිබඳවත් මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕන. ඒ වගේම අද රැස්වීම තියන්න අපි බලාපොරොත්තු වුණේ ඉදිරියේදී තත්ත්වය කෙසේ වේවිද කියන්න බැරි නිසා. අදාළ මාසය තුළ රැස්වීම පවත්වන්න ඕන. මැතිවරණ කටයුතුත් සිද්ධ වෙන අවස්ථාවක් තමයි ඉදිරියට එන්නේ. ඒක හින්දා තමයි අද රැස්වීම කල් නොදා තියන්න කටයුතු කරේ. ඒ පිළිබඳවත් දැනුවත් කරන්න ඕන.

සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන යටතේ අද රටේ පවතින තත්ත්වය පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න ඕන. කොරෝනා වෛරසය ඇත්තටම අද ජන ජීවිතය අඩාල වන මට්ටමට රට පුරා ව්‍යාප්ත වන මට්ටමක් පේන්න තියෙනවා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා ලංකාවේ සෞඛ්‍ය සේවය ගැන. ලෝකයේ ගත්තම ඉතාමත් දියුණු සෞඛ්‍ය සේවයක්, දියුණු අධ්‍යාපනයක් තියෙන රටක් විදියට ලංකාව මේ ව්‍යසනයෙන් ඉක්මනට අත්මිදෙයි කියන හැඟීම අපි සියලු දෙනාටම තියෙනවා. ඉතිං ඒක තුළ විශේෂයෙන්ම අපි සැලකිලිමත් වෙන්න ඕන. මොකද අපේ ප්‍රදේශ වලට බාහිරින් එන, විදේශගත වෙලා ඉඳලා එන පුද්ගලයින් පිළිබඳව අපි අවධානයෙන් සිටින්න ඕන. මොකද ප්‍රශ්නය තියෙන්නේ නිරෝධායන මධ්‍යස්ථාන වලට මේ අය යනවා නම් ගැටළුවක් නෑ. නමුත් හොරෙන් හරි ගුවන් තොටුපොළොන් පැනලා ඇවිල්ලා තැන් තැන් වල ඉඳීම තුළ තමයි මේ තත්ත්වය නිර්මාණය වෙලා තියෙන්නේ. ඒ මාරාන්තික රෝගය පිළිබඳව දැනුවත්වීමක් නොමැතිකම තමයි මේ තත්ත්වයට මුල්වෙලා තියෙන්නේ. ඒ පිළිබඳව සියලුම මහජන නියෝජිතයෝ හැටියට අපිට, අපේ ප්‍රදේශයට මේ රෝගයෙන් ආරක්ෂා කර ගන්න පුලුවන් වැඩ පිළිවෙලක්, ක්‍රමවේදයක් සහිතව අපි විමසිල්ලෙන් සිටීම තමයි මෙතනදී අපිට කරන්න පුලුවන් දේ. ඒක තමයි අපිට තියෙන වගකීම. එතනදී මම සියලුම මහජන නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනවා තමන්ගේ ප්‍රදේශ පිළිබඳව දැඩි සෝදිසියෙන්, විමසිල්ලෙන් කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ විශේෂ නිවේදනයක් විදියට ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, දැන් කතා කරපු නිසාම සභාවක් විදියට අපිට කරන්න පුලුවන් දේ මොකක්ද කියලා මොහොතක් අරගෙන කතා කරන්න. මොකද ඒක අද රටේ තියෙන වැදගත්ම ප්‍රශ්නය. මේකට මන්ත්‍රීවරුන්ගෙන් අදහස් අරගෙන සභාවක් විදියට අපිට කරන්න පුලුවන් දේ බලන්න. යම් යම් දේවල් කරන්න පුලුවන්නේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අදහස් තියෙනවා නම් අපිට කෙටියෙන් දන්වන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ශබ්ද විකාශන යන්ත්‍රය පාවිච්චි කරලා මුළු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම දැනුවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ ක්‍රමවේදය අපි දැනුවත් කරන්න ඕන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හරි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හරි සම්බන්ධ කර ගෙන වෛද්‍ය උපදෙස් අනුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙහෙම දෙයක් තියෙනවා. දැන් ඇත්තටම නිරන්තරයෙන්ම ටෙලිෆෝන් කෝල් එකක් ගත්තත් ඔය තොරතුරු ටික එනවා. අද සියලුම ජනමාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය මේ සියලු දේවල් වලට අංක 01 දැනුවත් කිරීම් අද වෙනකොට සිද්ධ කරනවා. ඒක තුළ ප්‍රචාරණය නම් යනවා. නමුත් සභාවක් විදියට අපිට ප්‍රචාරණ ක්‍රියාවලියට වැඩිය මිනිස්සු අතරට ගිහිල්ලා කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමා ඇත්තටම කවුරු කොහොම කිවුවත් අපේ ප්‍රදේශවල තාම මිනිස්සු හරියට දැනුවත් වෙලා නෑ. අපේ ප්‍රදේශවලත් රටින් ආපු අය ඉන්නවා. ඒ අය කියන්නේ නැහැ. උදාහරණයකට මම ගත්තොත් මට වුණත් කියන්න ප්‍රශ්නයක් තියෙනවා ළඟ පහත. හරියට මිනීමරුවෙක් අල්ලලා දුන්න ගානටමනේ

වැටෙන්නේ. ඒ නිසා සභාවේ යොමු අංකයක් දීලා සහා බල ප්‍රදේශයේ ඉන්න අය දැනුම් දෙන්න කිවුවොත් බොහොම තොගයක් එනවා මෙතනට කිසි කතාවක් නැතුව. ඒකට ප්‍රචාරණයක් දීලා ඒක සිද්ධ කළ යුතුයි. මේ ප්‍රදේශයේ විතරක් මේක කරලා හරියන්නේ නැහැ. ඒක වෙන කතාවක්. එකක් තියෙන්නේ ඒක කළ යුතුයි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** පූර්වාදර්ශයක් විදියට ඒක හොඳයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හපුගල ඉන්නවා, මෙහේ ඉන්නවා, හැම තැනම ඉන්නවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මිනිස්සුන්ට තව ටිකක් මේක ඇඟට දැනෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැනෙනවා විතරක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දේකුත් තියෙනවා. එනවුන්ස්මන්ට් එකක් ගියාම මිනිස්සු මීට වැඩිය බය වෙන තත්ත්වයක් තියෙනවා. බයවෙන එකේ වැරැද්දකුත් නෑ ඉතිං.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බය වෙන්න ඕන. බයවීම රෝගයට නරකකුත් තියෙනවා. ඒ බය නෙමෙයි. ඇත්තටම ඇවිල්ලා ඉන්න අපි දන්න අයත් ඉන්නවා. දැන් මේක කොහොමද ඉතාම ආරක්ෂාකාරී විදියට කියන්න පුලුවන්. නැත්නම් කවුද අල්ලලා දුන්නා වගේ කතාවක්නේ යන්නේ. එහෙම ක්‍රමයක් කොහේ හරි යෝජනා කරලා ගේන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ග්‍රාම නිලධාරි හරහා ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරලා ඒ මට්ටමෙන් ගියොත් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ යෝජනාව, අපි තව ටිකක් බලමු තව විශේෂ සභාවක් හරි කැඳවාගෙන ඉදිරියේදී බලමු. මේ තත්ත්වය තව ටිකක් බලමු. තවත් සතියක් වගේ මේ තත්ත්වය බලමු. අද වෙනකොට විදේශ වලින් එන අය හොඳින්ම සෝදිසියට ලක් වෙනවා. පහුගිය වෙච්ච ප්‍රශ්න ටික තමයි දැනට ඉතුරු වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අද පවා ඒවා කතා වුණානේ. ඒක පෞද්ගලික කතාවක් නෙමෙයි.

ඊළඟට ගරු සභාපතිතුමා අපිට කරන්න පුලුවන් දෙයක් තමයි තියෙනවා නම් සහනදායි මිල කියන එකත් පැත්තකට දාලා මාස්ක් අරගෙන සභාවෙන් ගත්ත මුදලටම දෙන්න හරි සකස් කරන්න. මොකද මේක පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාස්ක් නැනේ හොයා ගන්න.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒවා ලබා ගන්න ක්‍රමයක් රජය එක්ක හරි සාකච්ඡා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව සාකච්ඡාවක් අපි කරමු.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගාර්මන්ට් එකක් කතා කර ගත්තම මාස්ක් ටිකක් හදා ගන්න පුලුවන්. ගාර්මන්ට් තියෙනවානේ.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මමත් ඒකයි අදහස් කරේ. අපිට දෙන්න කියලා ඇනවුම දුන්නම සහනදායි මුදලකට හරි දෙන්න පුලුවන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අපේ බලප්‍රදේශයේ ගාර්මන්ට් තියෙනවානේ. අනිත් ඒවා නවත්වලා මේක අපිට සපයන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එහෙම වුණොත් ඒ පිළිබඳවත් අවධානය යොමු කරමු. සතියක් වගේ ඇතුළත තත්ත්වය පිළිබඳව බලලා විශේෂ සභාවක් හරි කැඳවලා ඒ පිළිබඳව කතා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක විශේෂ සභාවක් විදියට ඉල්ලන්න දෙයක් නැහැ. ඔබතුමා තීන්දු කරලා ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එහෙම කරමු, ඊළඟට සඳහන් කරන්න ඕන විශේෂ නිවේදන යටතේ. මම කිවුවා මාසිකව ජංගම සේවාවන් පවත්වනවා කියලා. නමුත් ඒක ප්‍රධාන වශයෙන් මැතිවරණය හින්දා, දෙවැනි කාරණාව විදියට මේක හින්දා අපි ඒක මැතිවරණයෙන් පස්සේ පවත්වන්න තීරණය කරා. ඉතිං ඒ පිළිබඳවත් සඳහන් කරන්න ඕන.

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-</u> නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** හපුගල, නිලදෙණිය, මුලනවත්තේ ඩිලානි මියගේ නිවස අසල කාණුව සඳහා පෙට්ටි බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** හපුගල ජන සභා ගොඩනැගිල්ල පින්තාරු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සෘජු ශ්‍රමික පදනම යටතේ කරන්නත් මම යෝජනා කරනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා, ඒ වගේම අපේ සභාවේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ඒ වගේම ජනමාධ්‍යවේදී මහත්වරුනි, ලේකම්තුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ඇත්තටම මගේ යෝජනා ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා ගරු සභාපතිතුමනි මට ස්තුති කිරීමක් සිදු කරන්න ඕන. පසුගිය පෙබරවාරි 18 වන දින, නිදහස් දින සැමරුම නිමිත්තෙන් ඉදිකරන ලද නිවාසය විවෘත කිරීමට ඔබතුමා, මගේ දේශපාලන නායක රමේෂ් පතිරණ මැතිතුමාත් පැමිණියා. විශේෂයෙන්ම ඒ දෙපලට මම ස්තුතිවන්ත වෙන ගමන් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙක් එම ආරාධනාවට ඒ නව නිවස විවෘත කිරීමේ කටයුත්තට පැමිණියා. ඒ සියලු දෙනාටත් මගේ ස්තුතිය පුද කරනවා. සභාවක් හැටියට මට ලබාදීපු සහයෝගයට ලේකම් මහත්මයා ඇතුළු නිලධාරි මහත්වරුන්ටත්, තාක්ෂණ නිලධාරි මහත්වරුන්ටත් කපුහෙම්පල කොට්ඨාශය නියෝජනය කරන මහජන නියෝජිතයා හැටියට ගරු සභාපතිතුමාටත්, ලේකම් මහත්මයාටත්, තාක්ෂණ නිලධාරි මහත්මයා ඇතුළු මුළු සේවක මඩුල්ලට ඒ ගෞරවනීය ස්තුතිය කොට්ඨාශයේ මහජන නියෝජිතයා හැටියට මුලින්ම පල කරන්න කැමතියි.

**03.** අඹගහවත්ත, ලන්සිගේ වත්ත මාර්ගයේ අවසන් කොටස සඳහා පැති බැම්මක් යොදා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 04.** කපුහෙම්පල, තල්ගහවත්ත නව නිවාස වලට පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 05.** අඹගහවත්ත, පොල් තවාන අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 06.** තොටගොඩ හේනවත්ත මාර්ගයේ අවසන් කොටස සඳහා පැති බැම්මක් යොදා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** බැදිපාර ආරම්භයේ ඇති බෝක්කුවේ සිලින්ඩර් ඉවත්කර කොන්ක්‍රීට් පෙට්ටි බෝක්කුවක් දැමීමට මම යෝජනා කරනවා. දැනට තියෙන්නේ අවධානම් තත්ත්වයක්. දෙනෝ දාහක් ඒ මාර්ගයේ ගමන් කරනවා. ඒ නිසා එම අවධානම මගහැරීම සඳහා කඩිනමින් පෙට්ටි බෝක්කුවක් දැමීමට යෝජනා කරන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ලොකු ගැටළුවක්, මම සභාපතිතුමා එක්කත් මේක කතා කරා. අදාළ ක්‍රමයට ඒක හැදුනේ නෑ. ගැඹුර මදියි ඒකයි කැඩුනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අපේ සහෝදර මන්ත්‍රී උදුල විශ්වජිත් මැතිතුමා උසාවියේ නඩුවකට ගියා. නඩුව අවසන් නිසා අධිවේගී මාර්ගයේ සභාවට පැමිණෙමින් සිටිනවා කියලා දැනුම් දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද පැමිණීමට නොහැකි වන සියලු දෙනාට නිවාඩු අනුමත කරන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 07.** කරාපිටිය මාතෘ රෝහල (යෝජිත මහමෝදර රෝහල මායිමේ ඇති පැල්පොලවත්ත සිට කරාපිටිය මාර්ගය දක්වා කාණු පද්ධතිය ඉදිකිරීම් භූමියේ පස් යොදා අවහිර කර ඇත. සභාවේ සම්පත් යොදා සකසන ලද මෙම කාණු පද්ධතිය අවහිර කිරීම නිසා විශාල ගැටලුවක් පවතී. මෙම කාණු පද්ධතිය පිළිසකර කරන ලෙස ඉදිකිරීම් ආයතනයට දන්වා යැවීමටත්, ඒසේ නොකරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ ස්ථානය ඔබතුමාට මතක ඇති. පසුගිය කාලය තුළ සභාවේ විශාල සම්පත් ප්‍රමාණයක් යොදා ගෙන ලොකු කැප කිරීමක් කරලා ඒ කාණුව කැපුවා. දැන් මේ වෙන කොට අර ඉදිකිරීම් භූමියේ තියෙන පස් ගෙනැල්ලා ඒ ජල මාර්ගය අවහිර වෙලා තියෙනවා. හැමදාම සභාවක් විදියට අපිට ගිහින් අපේ සම්පත් යොදා ගෙන මේ කාණු කප කප ඉන්න බැහැනේ. ඒ ගොල්ලෝ වුවමනාවෙන්ම තමයි මේ දේ කරලා තියෙන්නේ. ඒක දන්වා යැවීමට තමයි මම යෝජනා කරේ. එසේ නොකරන්නේ නම් අපි අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගමු.

දැන් බෝගහවේල්ල කාණුව සුද්ද කරගෙන යන වෙලාවේ මම ඒ කොටසට දැම්මේ නැහැ. හැමදාම කරන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 08.** කරාපිටිය කොට්ඨාශයේ පහත දක්වා ඇති ඇළ මාර්ග අවහිර කිරීම නිසා සුළු වර්ෂාවකදී පවා ජලයෙන් යටවීම සිදුවන බැවින් එම ඇළ මාර්ගයන් හි නියමිත ප්‍රමාණයන් සොයා පිළිසකර පවත්වාගෙන යාමට යෝජනා කරමි.

I. ජස්ටින් කන්ද, පැල්පොලවත්ත, සුවසෙවන හරහා බෝගහවේල්ල - ලබුදූව ඇළ මාර්ගය

II. ජස්ටින් කන්ද සම සෞඛ්‍ය විද්‍යා පීඨය අසලින් ඉලේපෙරුම මාවත හීන් ඇළ මාර්ගය

III. පරණ ගෙදර වත්ත, කජ්ජුගහවත්ත, මිල්ලගහ අද්දර ඇළ මාර්ගය

IV. කරාපිටිය ලබුදූව මාර්ගයේ රණවක මහතාගේ නිවස අසලින් බෝගහවේල්ල දක්වා ඇළ මාර්ගය

V. රිච්ඩ් පතිරණ විද්‍යාලය අසලින් ගැමුණු මාවත හරහා හිරිඹුර දක්වා ඇළ මාර්ගය

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මෙම ඇළ මාර්ග අඩි 05, 04, 03 වගේ ප්‍රමාණයේ ඒවා. අවමය අඩි 03 යි. සමහර ස්ථානවල අඩි 1/2 යි තියෙන්නේ. මේ දවස්වල බෝගහවේල්ල ඇළ මාර්ගය සුද්ද කරනවා. එක තැනක තියෙන්නේ අඩි 1/2 යි. පුවක් වැටක් ඉන්දලා. විශාල පුවක් ගස්. මම අන්තිමට මැෂින් එක දාලා සම්පූර්ණයෙන්ම ගස් ටික ගලවලා දැම්මා ඒ පැත්තට. විශාල ජල කඳක් ආපු වෙලාවේ අඩි 1/2 න් බහින්න බැහැනේ. ඒ නිසා සියලු ජල මාර්ග සුද්ධ කරන්න. මෙහේ තියෙනවාද දන්නේ නැහැ ඇළේ ප්‍රමාණය. ඇළේ ප්‍රමාණය හොයාගෙන ඒ මිනිස්සුන්ට දන්වලා මේ සියලුම ඇළ මාර්ග පිළිසකර කරන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන ලියනගේ මන්ත්‍රීතුමා ජේ.සී.බී. යන්ත්‍රය යොදවලා කරන ඒවා නම් කරන්න පුලුවන්. එක්ස්කැවේටර් කුලී පදනම මත අරගෙන අපි වැඩ කරේ. අපි අයවැයෙන් මුදල් වෙන් කිරීමක් කරලා නැහැ. එතන පොඩි හිරවීමක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම කතා කරේ මේක. කපන්න පුලුවන් ටික කරන්න. දැන් මේකේ අවහිර කරපු ස්ථානත් තියෙනවා. ඒ අවහිර කරපු පුද්ගලයන් දැනුවත් කරලා ඇළේ මේ ප්‍රමාණය තියෙන්න ඕන කියන එක දැනුවත් කරන්න. දැනුවත් කරලා එහෙම නොකරනවා නම් අපි ඒකට අවශ්‍ය පියවර ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 09.** ආචාර්ය රිච්ඩ් පතිරණ විද්‍යාලය මායිමේ චන්ද්‍රදාස මහතාගේ නිවසට අනතුරුදායක ගස් කඩිනමින් ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාගේද ගස් ටික. ඉස්කෝලේ ගස් ටිකද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඔව්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක විද්‍යාලයට දන්වලා යවන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** යවලා තියෙන්නේ. දැන් ගොඩක් කල්. වෙන්නේ නෑ. ක්‍රියාත්මක වෙන්නේ නෑ. අනතුර ඉවත් කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක කාර්යාලයට යවන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මුදල් අපෙන් යන්නේ නෑ. ඒ අනතුරුදායක පාර්ශවය මුදල් දෙන්න සුදානම්. ඒ නිසා අපි අනතුර ඉවත් වෙන්න ගහ කප්පවලා දාමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් ප්‍රශ්නයක් නැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අනතුරුදායක පාර්ශවය කිවුවා අපි මේ මුදල දෙන්නම් කපලා දාන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දුන්නද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැනුම් දීලා තියෙන්නේ. කාලයක් වෙනවා. අනතුර ඉවත් වෙන්න අපි ගහ මැදින් හරි කපලා දාමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මොන ගස්ද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඇට්ටෝනියා ගස්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 10.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව, නගර සභාවක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එසේ කියන්න හේතුව වන්නේ ගාල්ල මහා නගර සභාවට අල්ලපු ප්‍රාදේශීය සභාව තමයි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. මේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කලක සිට දියුණු වෙමින් පවතිනවා. මේ ප්‍රදේශයේ මාතෘ රෝහලක් ඉදිවෙනවා ඉදිරි කාලය තුළ. දැනට වැඩ පටන් අරගෙන ඒක අවසන් වී ගෙන යනවා. එය විවෘත කිරීමට නියමිතව තියෙනවා ඉදිරි කාලය තුලදී. ඒ වගේම විශ්ව විද්‍යාල තියෙනවා. ඊට අමතරව පළාත් සභා ගොඩනැගිල්ල ඇතුලු විශාල සංකීර්ණ කිහිපයක් තියෙනවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අයත්. ඒ කියන්නේ නගරයක් හා සම්බන්ධ ඒ අවශ්‍යතා තියෙන තැනක් වෙලා තියෙන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. එම නිසා මම යෝජනා කරේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව නගර සභාවක් කරන්න කියන තේමාව තියාගෙන. ඒක මම හිතන්නේ අපේ ප්‍රාදේශීය සභාවට ඉතා ගෞරවයක් ඇති වෙන අවස්ථාවක් වේවි. ඒ ගැන මම යෝජනා කරා. තමුන්නාන්සේලාගේ, ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමියන්ලාගේ, උප සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගේ අවධානය යොමු කරන්න. ඒක සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න කියන එක මම යෝජනා කරනවා. මම තනියම නෙමෙයි මුලු සභාවේම ඒකමතික යෝජනාවක් විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 11.** එගොඩ කනත්ත ගාමිණි මහතාගේ නිවස අසල සිට නන්දසිරි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඊට අමතරව මම මේක අවස්ථාවක් කර ගන්නවා පොඩි දෙයක් කතා කරන්න. මේ සභාවේ අපි කලින් කතා කරලා තීන්දුවක් ගනිපු දෙයක් තියෙනවා. ඒ තමයි බෝපෙ ශ්‍රී පියරතන පටුමගේ තල්ගහඹිවිට ඉඩමේ කරපු ගොඩ කිරීම සහ එම ඉඩම කැබලි කර විකිණීම සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සම්බන්ධව. මෙම ඉඩම කැබලි කරලා තියෙන්නේ. කැබලි කරලා සභාවට යොමු කරා. යම් කාලයකදී අනුමැතිය ලබා දෙන්න කියලා. නමුත් ඒකේ සුදුසුකම් නැති හින්දා, වෙන්දේසි කිරීමට සුදුසු නැති හින්දා එම අවස්ථාව ලබා දුන්නේ නැහැ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවෙන්. හැබැයි මම දන්නවා තාක්ෂණ නිලධාරිතුමිය ඒ අයට කිවුවා සභාවට කෙරෙන්න ඕන කටයුතු ටික ඉඩමක් වෙන්දේසි කරන කොට. ඒ කටයුතු ටික ඉදිරිපත් කරලා මේ සභාව දැනුවත් කරලා ඉඩම විකුණන්න කියලා කිවුවා. නමුත් මේ දිනවල ඒක වෙන්නේ නැහැ. එයා අත්තනෝමතික විදියට හිතුවක්කාර විදියට මේ ඉඩම් හිමි අය ඒ ඉඩම් කැබලි විකුණලා තියෙනවා. ඒක සභාවට යොමු කරලා නැහැ. ඊට පස්සේ මේ ඉඩම් ලබා ගනිපු අය ඒ අයට ඕන විදියට දැන් ඉඩම ගොඩකරගෙන යනවා. මේ කාරණය නිසා ප්‍රදේශවාසියෙක් විදියට මමත්, මගේ කොට්ඨාශයේ විදියට මාත් එක්කත් අමනාප වෙන විදියට මේ ඉඩම ගනිපු අය පත්වෙලා තියෙනවා. ඒක වෙනවානේ අබේසේකර මන්ත්‍රීතුමා. වටරැක පාලමට මෙහා පැත්තේ ඉඩම මේ. ඔබතුමත් දන්නවා ඇති. මේ මංගලිකා මහත්මියගේ ඉඩම. දැන් අරුණ ශාන්ත කියලා කෙනෙකුට එක ඉඩම් කෑල්ලක් දීලා. පාර අයිනෙම ඉඩම කාණුවත් එක්ක ගොඩ කරනවා. පහුගිය දිනක මම ලේකම්තුමත්, සභාපතිතුමත් මේ ගැන දැනුවත් කරා. මේ කාරණය මෙහෙම වෙන්න ගියොත් සභාවට තියෙන ගෞරවය නැති වෙනවා. සභාවක් විදියට යම් කිසි මට්ටමක් තියාගෙන සභාවක අපි වැඩ කටයුතු කරන අවස්ථාවක, මන්ත්‍රීවරයා කියන දේවත්, ඊට පස්සේ සභාපතිතුමා කියන දේවත් ඊට පස්සේ නිලධාරි මහත්ම මහත්මීන් කියන විදියටවත් මේ අය වැඩ කටයුතු නොකරන හින්දා සභාව හැල්ලුවට පත්වෙන ආකාරයට පත් වෙලා තියෙනවා. මේ අය නීතියක් ගැන එක්කෝ නොදන්නවා ඇති. නැත්නම් නීතිය ගණන් නොගෙන තමන්ට ඕන විදියට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තිබෙන ඉඩම් ටික ගොඩ කරලා වැසි ජලයෙන් ජනතාව යටවෙන තත්ත්වයට පත්කරන එකක් තමයි මට නම් පේන්නේ. මේක මගේ ප්‍රදේශයේ සිද්ධ වෙන්න දුන්නොත් මේක කොරෝනා වගේ බෝවෙලා යනවා. බෝවෙලා ගිහිල්ලා තියෙන්නේ. ඒක නිසා මම කියන්නේ දැඩිව තියෙන හින්දා. මම එදා එතනට ගියපු අවස්ථාවේ එතන මිනිස්සු රණ්ඩු වුණා. ඊට පස්සේ දෙවැනි වතාවේ ලේකම් මහතා ගියාමත් රණ්ඩු වුණා කියලා මට විජේපාල මහත්තයා කිවුවා. මිනිස්සු ඇන කොටා ගන්න තත්ත්වයට පත් වෙලා තියෙන්නේ මේ ඉඩම ගොඩ කිරීම නිසා. කාණු ගොඩ කිරීම නිසා ජලයෙන් යටවෙනවා. යටවීම වලක්වා ගන්න තමයි ඒ අය සටන් කරන්නේ. ඒ සටන පැත්තක තියලා ඉඩම

අයිතිකාරයා හෝ ගන්න මනුස්සයා ලාබෙට ඉඩම් ගන්නවා ඇති. අරගෙන ඕක ගොඩ කරලා තමන්ගේ අවශ්‍යතාවයට ඉඩම හදාගන්න තමයි කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට තාක්ෂණ නිලධාරි ලවා පරීක්ෂණය කරානම් හරිනේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** විධිමත් පරීක්ෂණයක් කරන්න මේ වගේ වැඩ නොකරන්න. මේ වගේ වැඩ නොකරන තත්ත්වයට පත්කරන්න කියලා මම යෝජනාව ගේනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට නවත්වලා තියෙන්නේ ඒ ගොඩ කිරීම. ඒ වගේම එයාට සභාවට එන්න කියලා දැනුම් දීලා තියෙන්නේ.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා හා ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කපුහෙම්පල අර ෆිනෑන්ස් ඉඩමේ අවශ්‍ය කාණුව තව වෙනකම් සකස් කරලා නෑ. ඔබතුමයි, මමයි, ලේකම්තුමයි ගියා බලන්න. අදාල වතුර බැස්සවීමට සකස් කරලා නෑ. තාම අර පොඩි සිලින්ඩරයක්නේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අනුමැතිය ලබා දෙන්නේ නෑ උප සභාපතිතුමා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ ගෙවල්වල අය අදටත් ඒ ප්‍රශ්නය කතා කරනවා. පැයක් වැස්සොත් ඒ ගෙවල් ටික යටවෙනවා. ඉතා ඉක්මනින් ඔබතුමා අවධානය යොමු කරලා ඒ අවශ්‍ය කටයුත්ත කරන්න.

ඊළඟට තව පොඩි කාරණයක් තියෙනවා ගරු සභාපතිතුමනි, ගියවර අප්‍රේල් මාසයේදී අපිට සහරාන්ගේ ප්‍රහාරය එල්ල වුණා. මේ සැරේ කොරෝනා ප්‍රශ්නය. විශේෂයෙන්ම මට මේ කලේගාන ප්‍රදේශයේ කීප දෙනෙක්ම කතා කරා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ අවධානය යොමු කිරීම පිණිස. ගියවර ඒ ප්‍රශ්නයෙන් මේ මිනිස්සු බැට කෑවා. මෙවර කොරෝනා ප්‍රශ්නය නිසා විදේශිකයන්ගේ පැමිණීම නැති නිසා නැවතත් කුඩා කර්මාන්ත රැකියා කරන මහත්ම මහත්මීන්ගේ ඒ ස්වයං රැකියා අඩාල වෙලා තියෙනවා. සභාවක් හැටියට අපේ කොට්ඨාශයේ තියෙන කැටයම් ගම්මානවල ඒ ජනතාවගේ ජන ජීවිතය ගොඩ නගා ගන්නට ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කිරීම පිණිස සභාවේ යෝජනාවක් සම්මත කරලා යවන්න කියලා මම යෝජනා කරනවා. දැඩි ආර්ථික අපහසුතාවයකින් ඒ මිනිස්සු කල් ගෙවන්නේ.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 12.** නරාවල රුමස්සල වත්ත පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 13.** වලවත්ත, අඹගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 14.** අප බල ප්‍රදේශයේ ප්‍රධාන මංසන්ධිවල සභාව මඟින් ජංගම වෙළඳසැල් ආරම්භකර ඒ සඳහා අඩු ආදායම්ලාභී පවුල් වල අයට අවස්ථාව ලබාදෙන ලෙස යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි, හොඳ යෝජනාවක් අපේ චනක මන්ත්‍රීතුමා කරන්නේ. මොකද ස්වයං රැකියා කරගෙන යන්නේ අහිංසක ස්වයංරැකියාලාභීන්. හැබැයි ගරු සභාපතිතුමනි, සමහර කොට්ඨාශවල ග්‍රාම නිලධාරි මහත්වරුන්ගෙන්, ග්‍රාම නිලධාරි මහත්මීන්ගෙන්, ඒ වගේම පොලීසියේ මහත්වරුන්ගෙනුත් මේකට පුදුමාකාර හිරිහැරයක් තියෙනවා. හැබැයි කසිප්පුකාරයාට හිරිහැරයක්

නෑ. කසිප්පුකාරයා ජාමෙට කසිප්පු විකුණනවා අහිංසක මනුස්සයෙක් ස්වයංරැකියාව කරගෙන ආප්ප කඩේ පාර අයිනේ තියන් ඉන්න කොට පොලීසියත් එනවා. ග්‍රාමනිලධාරීනුත් එනවා. ප්‍රාදේශීය ලේකම්තුමිය එනවා කියලා නම් මෙතෙක් ආරංචි වුණේ නෑ. ඒ නිසා මේවා වලට සභාවක් හැටියට මැදිහත් වෙලා ඒ ව්‍යාපාර කටයුතු කරගෙන යන්න අවස්ථාව ඒ ස්වයංරැකියාලාභීන්ට දිය යුතුමයි. ඒ යෝජනාව මම ස්ථිර කරා. ඒ යෝජනාව බොහොම හොඳ යෝජනාවක්. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, බොහොම හොඳ යෝජනාවක් ඒක. ඇත්තට මේ අය ආණ්ඩුවෙන් රස්සාවල් ඉල්ලන්නේ නැතුව එහෙම කරගෙන යනවා. හැබැයි පරස්පරයක් මතුවෙනවා මෙතනදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවසර, අනවසර තත්ත්වයට මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අවසර අනවසර කතාව කියන්නේ, සභාවෙන් හදලා දෙනවා. හැබැයි එකක් තියෙනවා අද වෙනකොට ඇවිල්ලා තියෙනවා. මේ සභාවේ මුලු මන්ත්‍රීවරුන්වම ගෙනල්ලා දැනුවත් කරා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්. අපිව දැනුවත් කරා මෙහෙම මෙහෙමයි කියලා චක්‍රලේඛනයකින්. නමුත් අද වෙනකොට ඒ පිළිබඳව, ඒ කරගෙන යන යම් යම් දේවල් පිළිබඳව අපේ සන්තෝෂයක් නෑ. මොකද හේතුව දැන් ගත්තම සමහර ඉතාම නරක තත්ත්වයේ තියෙන තැන්වලට ගිහිල්ලා බලලා නෑ. ඒ කියන්නේ මේ අහිංසක මිනිහෙක් එක පාරට එහෙම කරලා දාන්න ඕන කියන කතාව නෙමෙයි. නමුත් කාලයක් දීලා හරි මොනවාහරි වැඩ පිළිවෙලක් යන්න ඕන ඒකට. මොනවාහරි ක්‍රමයක් ඒ මිනිස්සුන්ට හදාගන්න බෑ. කඩයක් කරන කොට, පොඩි තේ කඩයක් කරන කොට යම් කාලයක් දීලා ඒ මිනිස්සුන්ට ඒක හදාගන්න ක්‍රමයක් හදන්න ඕන.

ඊළඟට දැන් මේක හැදුවම ප්‍රශ්නයක් එනවා. ඒ පිරිසිදු අපිරිසිදුභාවය පිළිබඳ ප්‍රශ්නය. ඒක හින්දා ඒකට හරියන විදියට කරන්න. ඔබතුමාගේ යෝජනාව හොඳයි. එකක් තියෙනවා අර ලබුදූවේ වැන් එකක ඇවිල්ලා කරන එක. ඒකෙන් අපිරිසිදු වෙන්නේ නෑ. සුද්ධ කරගෙන යනවා. ඉතිං අපිටත් ආදායමක් එන විදියට මම හිතන්නේ එහෙම දෙයක් කරාම කිසි වැරැද්දක් නැහැ. ඒක හරි විදියට ප්‍රමිතියට හදලා දීලා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේක ඇත්තටම හොඳ යෝජනාවක් අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව දැම්මේ ගල්වල කන්දේ නිශාන්ත මහත්තයා පහුගිය දිනක බෝගහ හන්දිය ප්‍රදේශයේ ඇඹුල්දොඩම් වලින් බීම හදන එකක් හදා ගත්තා පාර අයිනේ. සමෘද්ධි එකේ කඩයක් එයා කුලියට අරගෙන තිබුණා. ඒක සමෘද්ධි සංගමයෙන් දීපු කඩයක් සමෘද්ධිලාභියෙකුට. ඒ කඩයක් කුලියට අරගෙන තමයි එයා කරේ. බිස්නස් එක හැදිලා හොඳට කරගෙන එනකොට සමෘද්ධි නිලධාරියා ඇවිත් ප්‍රශ්නයක් මතු කරලා තියෙනවා එයාට ඒ කඩය කරන්න දෙන්න බැහැ කියලා. මොකද හේතුව වෙන කෙනෙකුට දීපු කඩයක් නිසා කියලා. ඇත්තටම අහිංසක මනුස්සයෙක්. ඒක නිසා තමයි මම බැලුවේ. මේ වගේ ප්‍රශ්න ගොඩක් මේ ප්‍රදේශයේ තියෙන්න පුලුවන්. රැකියාවල් නැතුව ඒ වගේ වැඩ කරන්න පුලුවන් අය ඉන්නවා. ඒ නිසා තමයි මේ යෝජනාව දැම්මේ. අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ හොඳ අධීක්ෂණයෙන් කරලා මේකේ පිරිසිදුභාවය හා විධිමත්භාවය පිළබඳව අධීක්ෂණයක් කරලා ක්‍රමවේදයක් හදලා කරගෙන යන්න පුලුවන් කියලා හිතලා තමයි මම යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 15.** වියළි කාළගුණය පවතින මේ කාලසීමාව තුළ පුරන් වූ කුඹුරුවල ඇති ජලය බැසයන කුඩා කාණු එක්ස්කැවේටර් යන්ත්‍රයක් සහ කම්කරුවන් යොදාගෙන සුද්ධ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේක මැෂින් එකක් දාලා සුද්ධ කරන්න බැහැ. ඇත්තටම ලොකු ප්‍රමාණයක් යනවා. ගොවිජන සේවා එකෙන් බෝගහ හන්දියේ ඉඳලා කුඹුරේ කාණුව සුද්ධ කරගෙන ආවා. අඩි 04 කාණුව කපන්න වුණේ අඩි 12 ට අඩි 10 ට. බාජ් එකක් දාලා කපන කොට ප්‍රමාණය විශාල වෙනවා. දැන් තියෙන කාළගුණයත් එක්ක එක්ස්කැවේටර් යන්ත්‍රයක් යන්න පුලුවන් කුඹුරුවල. ගිහිල්ලා අඩි 02 අඩි 03 කාණු ටික කපා ගත්තොත් ඊළඟ වැසි කාලය එන කොට ගංවතුර තත්ත්වය මගහරවා ගන්න පුලුවන් වේවි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා තමයි

මම යෝජනා කරේ. මේ යෝජනාව ඉක්මනින් ක්‍රියාත්මක කළ යුතුයි. දැන් කාළගුණය වෙනස් වෙමින් පවතිනවා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මන්ත්‍රීතුමා කලිනුත් කිව්වේ එක්ස්කැවේටර් යන්ත්‍රය සඳහා. මොකද ඒකට අයවැයෙන් මුදල් වෙන්වීමක් වෙන්න ඕන. අපි එහෙම නැතුව තියෙන ප්‍රධාන කරුණු වලට තමයි යෙදෙව්වේ. ඔබතුමාගේ අර ඇළ මාර්ගය සුද්ධ කරන්න ගත්තා. ඒ වගේ ප්‍රධාන කාරණා ටිකට තමයි ගත්තේ. ඉතිං ඒකෙදි අපිට අයවැයෙන් මුදල් වෙන් නොකරපු නිසා එතනදී ගැටළුවක් මතු වෙනවා. නමුත් මෙතන ප්‍රශ්නයක් තියෙනවා මන්ත්‍රීතුමා. මේක කැපුවත් ආයෙමත් වහිනකොට මඩත් එක්ක කාණුව වැහෙනවා. මේකට ස්ථිර මොකක් හරි විසඳුමකට යන්න ඕන මම දකින විදියට. මොකද අනිත් එක පුරන් වෙච්ච කුඹුරු තියෙන්නේ. කුඹුරු හිමියන්ටත් වගකීමක් තියෙනවා එතනදී ඒකට වැඩපිළිවෙලක් සකස් කර ගන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** දැන් සභාපතිතුමා වැඩේ තියෙන්නේ කුඹුරු තියෙන මිනිස්සු කැමතියි කුඹුරු නොකර ඉන්න. මොකද ඒ මිනිස්සුන්ට අවශ්‍යතාවය තියෙන්නේ කුඹුරු කරන්න නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං එහෙම නම් ඇයි අපි බලෙන් නොකරන දේට කරන්නේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පොඩ්ඩක් මම කියන එක අහන්නකෝ. නරාවල පැත්තේ ලොකුවට මේ ප්‍රශ්නය තියෙනවා. කුඹුරු තියෙන මිනිස්සු කරන්නේ නැහැ. කුඹුරු කරනවට වැඩිය කඩෙන් හාල් ටික ගන්න එක ලාභයි. හැබැයි ප්‍රශ්නය තියෙන්නේ ඒ මිනිස්සුන්ට වුවමනාව තියෙනවා කුඹුරු ටික ගොඩ කර ගන්න. ඒ අයට කොහේ යටවුණත් කමක් නෑ. ඒ අය පිටවානක්වත් කපන්නේ නෑ. කාණු සුද්ධ කරන්නෙත් නෑ. කුඹුරු පුරන්වෙලා යන්න අරිනවා. හැබැයි ඒකෙන් ප්‍රශ්නයක් වෙන්නේ පාර අයිනේ ඉන්න, ඇළ අයිනේ ඉන්න කුඹුරු නැති සාමාන්‍ය මිනිස්සුන්ට. අර මිනිස්සුන්ට ඕන කුඹුරු ගොඩකර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගොඩකරන්න බැහැ. පුරන්වුණත් ගොඩකරන්න ක්‍රමවේදයක් නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අපි දැකලා තියෙනවානේ ක්‍රමානුකූලව ගොඩකරපු කුඹුරු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමයි මන්ත්‍රීතුමා අපිට කොහොමත් කරන්න වෙන්නේ මෙහෙම. ඒ යෝජනාව හොඳයි. කිසි ප්‍රශ්නයක් නැහැ. සාමාන්‍යයෙන් මන්ත්‍රීවරයෙක්ගේ ප්‍රතිපාදන තියෙනවානේ. එහෙම යන විදියට දාලා කරන්න වෙන්නේ. අයවැයෙන් මුදල් වෙන් වීමක් වෙලා නෑ එක්ස්කැවේටරයකට ගෙවන්න. ඒකයි වැඩේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අපිට කොන්ත්‍රාත් පදනම යටතේවත් දීලා කරන්න බැරිද මුදලක් වෙන් කරලා සභාවෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම වුණොත් අරහෙම තමයි කරන්න වෙන්නේ. දැන් මන්ත්‍රීවරයෙක්ගේ යෝජනා යටතේ ඒ මන්ත්‍රීවරයාගේ කොට්ඨාශයට රුපියල් ලක්ෂ දහයක් වෙන් වෙනවා නම් ඒකෙන් කරන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා, කලින් එක්ස්කැවේටර් යන්ත්‍ර කුලී පදනමට ගන්න කොට මුදල් වෙන් කරාද අය වැයෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමනේ. එක එක ඒවා යටතේනේ සල්ලි වෙන් කරන්නේ. සෞඛ්‍යයට, මාර්ග වලට ඒ විදියටනේ වෙන් කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම මුලින්ම එක්ස්කැවේටර් යන්ත්‍රය යොදලා කපපු කාණුව තමයි ඒ. ඒ ඉඩමේ තියෙන කාණුව තමයි කැපුවේ. එදා අපිට රුපියල් එක්ලක්ෂ එක්දාහක් වගේ තමයි වියදම් වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. අපි එහෙම නම් මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශ වලට වෙන් වෙන මුදලින් කරමු. ඒක එහෙම කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒ මුදල මගේ ප්‍රතිපාදන වලින් වෙන් වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යන මුදල මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන වලින් අඩු කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒක එහෙම දෙන්න. ප්‍රශ්නයක් නැනේ එතකොට. වැඩේ කෙරෙනවානේ. කාණුව කපන්න ලක්ෂ දෙකක් ගියානම් ඒ මුදල මන්ත්‍රීවරයාගේ ප්‍රතිපාදන වලින් වෙන් වෙනවා. ඒක සාධාරණයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සාකච්ඡා කරලා බලමු මොකක්ද කරන්න පුලුවන් කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගැටලුවක් තියෙනවා. මැෂින් එකකින් කපන්න බැරි තැන් තියෙනවා. කම්කරුවෝ යොදවලා තමයි කපන්න වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 16.** නරාවල පන්විල භාවිතයට නොගන්නා පොදු ළිඳ වසා දමා එම ඉඩම් කොටස හා පන්විල බිලූ මවුන්ටන් වෙන්දේසි ඉඩමේ සභාවට අයත් ඉඩම් කෙටසත් එකතුකර ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සඳහා සංවර්ධනය කර දෙන මෙන් යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ ඉඩම ඔබතුමා ගිහින් බැලුවා. ළිඳ භාවිතයට ගන්නේ නැහැ. බිලුමවුන්ටන් වෙන්දේසි ඉඩමෙන් සභාවට වෙන් කරපු ඉඩමෙන් පොඩි කොටසක් ඒ අය දෙන්න කැමතියි. පර්චස් 08 ක් 10 ක් වගේ තමයි දැනට ළිඳට වෙන් කරපු කොටස. ඒ කොටසත්, බිලූමවුන්ටන් වෙන්දේසි ඉඩමේ කොටසත් අරගෙන ප්‍රජා ශාලාවක් ඉදිකරන්න යෝජනා කරේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ළිඳ පාවිච්චියට ගන්න බැරිද.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගන්න බෑ. ළිඳ කඩා වැටිලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ළිඳ කඩා වැටිලා තියෙන්නේ මමත් ගිහින් බැලුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ළිං වැහීමේ සංස්කෘතිය නම් ඇත්තටම හොඳ නෑ. දැන් බලන්න අද තව වෙනකම් සභාවක් විදියට ලැජ්ජ වෙන්න ඕන ගැමුණු මාවතේ ළිඳ සම්බන්ධව. දැන් ඒක ගොඩ කරලා අයිතිකරගෙන. කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ඒකේ වැට අපි ගැලෙව්වානේ. ඒ අයට දුන්නේ නෑ. ගහපු වැටවල් ගලවලා අයින් කරා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කම්බි වැටවල් ටික ගැලෙව්වා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කම්බි ගහලා සභාව සතු ඉඩමක් කියලා බෝඩ් එකක් ගහන්න ඕන. ඒකනේ කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** තුන් පාරක් වැට ගලවන් ගියා. ඒ වුණාට ඒ ඉඩම භුක්ති විඳිනවා ගොඩ කරලා. තුන් පාරක් වැට ගැහුවා. තුන්පාරම ගලවන් ගියා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සභාව සතු දේපලක් කියලා නම් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාවකල් තබන ලදී.)**

<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මා හිතවත් මාගේ සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි. ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරි මහත්ම මහත්මියනි,

**17.** යූ.ජී. හර්ෂණ දිල්ෂාන් මයා කම්කරුවෙකු වශයෙන් බඳවා ගැනීමට යෝජනා කරමි.

මම පොඩ්ඩක් පැහැදිළි කරන්න ඕන. මගෙන් තුන් දෙනෙක් යෝජනා වුණා. ඒ තුන් දෙනාම රස්සාවට ආවේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මෙතනට අදාළ නෑ. ඔයා දාන්න දාගන්න එක. තේරුමක් නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** මොන කොට්ඨාශයෙන්ද මේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සභාපතිතුමාගේ කොට්ඨාශයේ. මෙහේ වැඩ කරන කෙනෙක්ගේ පුතෙක්.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** කලේගාන කොට්ඨාශය තියෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒක තමයි.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** මේක කලේගාන කොට්ඨාශයට ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මේ යෝජනාව මම ඉල්ලා අස්කර ගන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනික මේ සභාවක් මෙච්චර මේකට කතා කරන්න ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව එතුමා ඉල්ලා අස්කර ගත්තා. ඒක ස්ථිර වුණේ නෑ. ඒ යෝජනාව ඉල්ලා අස්කර ගත්ත නිසා සම්මත වුණේ නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 18.** වයිනේරු කන්ද උඩ කොටසේ පැත්තට ආරක්ෂිත පැති වැටක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 19.** මාම්පිටිය වසමට අයත් බෝක්කු දෙක සඳහා ආරක්ෂිත පැති වැටවල් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 20.** මාම්පිටිය කම්මලට යන පාර වර්ෂා කාලයේදී යටවන නිසා කාණුව කපා වතුර බැසයාමට යකඩ දැලක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ මාම්පිටියේ මේවා එකට මොකක්ද ගහන්නේ. කම්බි ගහලා හදනවාද?.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** වතුර ගලන නිසා දැලක් වගේ එකක් දාන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් මත බලලා කරන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමා අර වී. සී. පාරේ ගෙවල් හතකට යන පාරේ සුමතිපාල මහතා සමග මම පොලීසියට ගියා. අර කාන්තාව කියලා තියෙනවා අඩි 06 ක පාරක් දෙන්නම් කියලා. අත්සන් කරලා තියෙනවා. පොලිස් ස්ථානාධිපතිතුමා කිව්වා සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කියලා පැමිණිල්ලේ පිටපතක් ලබා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද දැන් වෙලා තියෙන්නේ ඒකේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒකේ විකල්ප මාර්ගයකට පර්චස් 06 ක් දෙන්නම් කියලා එයා අත්සන් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පර්චස් 06 ක් ද අඩි 06 ක්ද.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** අඩි 06 ක්. ඒකට ඔබතුමාගෙන් ලිපියක් ගේන්න කිව්වා පැමිණිල්ලේ පිටපත ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඉතිං සුමතිපාල මහතාගේ පාර්ශවයේ ගැහැනු කෙනෙක්මනේ කැමති නැත්තේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එයත් දැන් කැමතියි. පොලිස් ස්ථානාධිපතිතුමා එක්කත් කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** පොලීසියෙන් අවශ්‍ය නෑ අරගොල්ලෝ එකඟනම්. පොලීසියට අදාළ කාරණාවක් නෙමෙයි. දෙගොල්ලෝ එකඟනම් විකල්ප පාරක් දෙන්න පුලුවන්. ඒක අපිට විසඳන්න පුලුවන්. පොලීසියේ පැමිණිලි පිටපත් ගන්න අපි මැදිහත් වෙන්න ඕන නෑ. ඒ දෙගොල්ලෝ අතරේ එකඟතාවයක් තිබුණේ නෑනේ මම තුන්පාරක් කැඳවපු වෙලාවේ. ඒ ගොල්ලෝ පොලීසියට එකඟයි මට එකඟ නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** විකල්ප මාර්ගය දෙන තැන පොඩි සාධාරණයක් තියෙන්න ඕන නේ. ඒකයි ඒ අය කියන්නේ. මේ අය ඒ කැපකිරීම කරන්න සූදානම්. ඒ පාර නිකං ඕන නැති විදියට නේ දෙන්න හදන්නේ. ඒකට එතනදී මැදිහත් වෙන්න කියලා ගරු සභාවෙන් මම ඉල්ලනවා. පුලුවන් නම් බලන්න. යන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** හරි දැන් අපි පොලිස් ස්ථානාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නම් දවසක එන්න කියලා. එතකොට ඉවරයිනේ. එතකොට එහේදී එකඟ වෙච්ච එකේ පිටපතකුත් අරගෙන ඒවීනේ. පොලිස් ස්ථානාධිපතිතුමාට අපි දිනයක් දැනුම් දෙන්නම් අහවල් දවසට එන්න කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** ඒකේ පිටපතක් ගන්න සභාපතිතුමාගෙන් ලියුමක් ගේන්න කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** පිටපතක් ගන්නවාට වැඩිය වටින්නේ අපිත් ගිහිල්ලා පොලිස් ස්ථානාධිපතිතුමත් එතනට ඇවිල්ලා පැමිණිල්ලේ එකඟතාවය ක්‍රියාත්මක කිරීම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** පැමිණිල්ලේ අංකය ගත්තම පිටපතක් ගන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** පැමිණිල්ලේ පිටපතක් ගන්න ලියුමක් ගේන්න කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** හරි එහෙම නම් ඉතුරු ඒවා කර ගන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** නැහැ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කියන දේ තේරුම් ගන්නේ නැහැනේ. ස්ථානීය පරීක්ෂණයක් පොලිස් ස්ථානාධිපතිතුමයි, අපියි ඒ මිනිස්සුයි ගිහින් කරන එක වඩා හොඳ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** අරයා කියලා තියෙනවා අඩි 06 ක් දෙන්නම් කියලා. ඒක සනාථ කර ගන්න එපැයි. ඒක ලිඛිතව ගන්න එපැයි සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** පොලිස් ස්ථානාධිපතිතුමාට ඔය කාරණයට කිව්වම හරි මෙන්න අහවල් දින ඔබතුමා එන්න ස්ථානීය පරීක්ෂණය කරන්න කියලා. පැමිණිල්ලේ පිටපත් මුකුත් ඕන නැහැ. දෙගොල්ලොන්ගේ එකඟතාවය එතනදී ගත්තා ඔබතුමාට පැමිණිල්ලේ පිටපතක් ගන්න මම ලියුමක් ලබා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** ගරු උප සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා මම නියෝජනය කරන කොට්ඨාශයේ ශිල්පීන් ගැන කතා කරාට. ඒකට මම යෝජනාවක් කරනවා. ලක්සල රාජ්‍ය ආයතනයක්. ඒකෙන් පොඩි ප්‍රමාණයක හරි මේ අවස්ථාවේ ශිල්පීන්ගෙන් බඩු ලබා ගන්න කියලා. උප සභාපතිතුමාට මම නැවතත් ස්තුතිවන්ත වෙනවා. ඒක මම ලියා ගෙන ගෙනාවා. ඔබතුමා ඒක ඉස්සෙල්ලා කියපු එකට ස්තුතිවන්ත වෙනවා. භාණ්ඩ මිලදී ගන්න කියලා මම යෝජනාවක් ගේනවා. ලක්සලටනේ ගොඩක් කට්ටිය සපයන්නේ. ඒකෙන් ජීවත්වෙන්න රුපියල් දහ දාහක වගේ ප්‍රමාණයක බඩු ශිල්පීන්ගෙන් මාසෙකට ගන්න කියලා සභා යෝජනාවක් යවන්න. විමල් වීරවංශ මැතිතුමා කුඩා කර්මාන්ත ඇමති විදියට ඉන්නේ. එහෙට ඉල්ලීමක් කරන්න කියලා මම යෝජනා කරනවා.

මෙතන එහා කොටසේ ශීල්පීන්ගේ අවශ්‍යතාවයට ඉදිවෙන ගොඩනැගිල්ලේ ඉඩමේ තත්ත්වය කොහොමද දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක මැනලා ඉවර කරන්න මිනින්දෝරු මහතා දිනයක් ලබාදේවි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- හරි. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා, මට පුංචි වෙලාවක් දෙන්න. විශාල ඉල්ලීමක් කරන්න තියෙනවා. නරාවල කොට්ඨාශයේ මට අපේ තාක්ෂණ නිලධාරිතුමා එක්ක වැඩ කරන්න බැහැ. වෙනත් තාක්ෂණ නිලධාරි කෙනෙක් ඒ කොට්ඨාශයට ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා. මම දිනූෂ මහත්තයාට ගිය සතියේ කිව්වා යෝජනා වගේකට ඇස්තමේන්තු හදලා දෙන්න කියලා. හදලා දෙන්නම් තව දවස් තියෙනවා කිව්වා. දවසින් දවස කෝල් කරලා කිව්වම කිව්වා අඟහරුවාදා වෙනකොට හදලා දෙන්නම් කියලා. අද උදේ කතා කරලා අහනකොට කිව්වා අද අපි නිවාඩුලු. අද නිවාඩුව ගැටලුවක් නැහේ. අද නෙමෙයිනේ හදන්න කිව්වේ. සතියකට කලින් හදන්න කිව්වේ. මට දිනූෂ මහතා සමග වැඩ කරන්න බැහැ. ඒ නිසා වෙනත් තාක්ෂණ නිලධාරි මහත්මයෙක් ඒ සඳහා යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ ගැටලුව එක්ක අපිට යන්න අමාරුයි. ප්‍රශ්න ගණනාවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- සභාපතිතුමා කලිනුත් ඔය ප්‍රශ්නයම ආවා. කතා කරා එවෙලෙට විතරයි. ආයේ සම්ප්‍රදායක් විදියට අර විදියටම යනවා. තේරුමක් නැහැ. අපිට නිලධාරීන් එක්ක ගැටුම් ඇති කර ගන්නත් බැහැ. ඒ නිසා අපිට වැඩ කරන්න පුලුවන් නිලධාරියෙක් ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා. මොකද අපිත් හැල්ලුවට ලක් වෙනවා. අපිට දෙයක් කියලා කරගන්න බැරිනම් ඇති වැඩකුත් නැහේ සභාවෙන්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- සභාපතිතුමනි, ඔය ගැටුම මුලින්ම මාත් එක්ක තමයි ඇති වුණේ. නවක මන්ත්‍රීවරුන්ට ලොකු අපහසුතාවයක් තියෙනවා. නැත්තේ නැහැ. මම ඕක කලින් කිව්වා. නිලධාරියෙක් නැවත ගෙන්වා ගැනීමේ අඩුපාඩු ඇති. නමුත් මේ ඉඳලා කරන අපහසුතාවය ඊට වඩා වැඩියි. මානසික පීඩනයක් අපේ මන්ත්‍රීවරුන්ට තියෙනවා. මොකද හේතුව කියන වෙලාවට එන්නේ නැහැ. මැනපු පාර එක්කෝ දිග වැඩියි. එක්කෝ කොටයි. බෝක්කුවක් මැන්නොත් අඩි 04 ක් අඩුයි. ඇත්ත කතාව මේක. මේ ප්‍රශ්නය තියෙනවා කාලයක් තිස්සේ. මම ලේකම් මහත්තයටයි සභාපතිතුමාටයි කිව්වා. මේ ප්‍රශ්නය තියෙනවා. නවක මන්ත්‍රීවරුන්ට ලොකු අපහසුතාවයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සභා තීන්දුවක් ගන්න. මම ඒක ක්‍රියාත්මක කරන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ඉවත් කරන්න ඇත්තටම මේ මන්ත්‍රීවරුන්ගේ වැඩ වෙන්නේ නැත්නම්. ඒ මිනිස්සු මානසිකව පීඩනයකට ලක් වෙලා ඉන්නේ. මම අද යෝජනා කරනවා.

ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා ස්ථාන මාරුවක් ලබා දී වෙනත් ආයතනයකට යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා** ඃ- සභාපතිතුමනි, දැන් අපි සභාවක් විදියට මාරු කිරීම කරන්න නෙමෙයි, දැන් චෝදනා ගොඩක් එල්ල වුණා. එතුමාට පරීක්ෂණයක් කරන්න. චෝදනා වලට පරීක්ෂණයක් කරලා ඊට පස්සේ දෙයක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මෙහෙමයි මන්ත්‍රීතුමා, මටත් දිගින් දිගටම බැහැ. දැන් මෙතුමාගේ ප්‍රශ්නයක් වෙලා තියෙනවා. උප සභාපතිතුමාගෙත් බෝක්කුවක් දාලා ප්‍රශ්නයක් වුණා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා** ඃ- අපිටත් ප්‍රශ්න තියෙනවා. මටත් ගොඩකන්දේ ප්‍රශ්න තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් මේක දිගින් දිගට යන්න බැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපි මහජනතාව ඉදිරියේ අපහසුතාවයට පත් වෙලා තියෙන්නේ. එයාගේ අධීක්ෂණය යටතේ කර්මාන්ත ඇස්තමේන්තුවට කරන්න බැරිනම් කියන වෙලාවට, කියපු ඇස්තමේන්තුව, යෝජනාව, නිවැරදි නම් පරීක්ෂණ ඕන නැහැනේ මන්ත්‍රීතුමා. පරීක්ෂණ මොකටද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාවක් හැටියට කියන්න බැහැනේ මේ නිලධාරියා මාරු කරන්න කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** පරීක්ෂණ ඕන නැහැ. අපි යෝජනාව ගෙනල්ලා තියෙනවා. යෝජනාව ස්ථිර වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අවුරුදු 05 සම්පූර්ණයි.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එකක් නෙමෙයි හැමදාම ප්‍රශ්න මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාත් මගෙන් ඉල්ලීම කරා ස්ථාන මාරුව යන්න දෙන්න කියලා. එතුමා ඉල්ලීමක් කරලා තිබුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මෙවැනිම කාරණයක් මේ සභාවේ මතු වුණා මේ නිලධාරියා සම්බන්ධයෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර කියන කාරණා පිළිබඳව කතා දෙකක් නැහැ. කාලයක් තිස්සේ කිය කිය ඉඳලා අද කියන්න බැහැ නිවාඩුයි කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවක් හැටියට ප්‍රශ්න තියෙනවා නම් මේ සභාවේ ඇවිල්ලා කතා කරන්න පුලුවන්. නමුත් නිලධාරියෙක් සම්බන්ධව ක්‍රියාත්මකවීමේදී මේ ලේකම්තුමා දන්නවා ඒකට අදාළව ක්‍රමවේදයක් තියෙනවා. නිලධාරියෙක් ගැන අපිට තනි තීන්දුවක් ගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තනි තීන්දුවක් ගන්නේ නැහැ. අපිට මෙහෙම පුලුවන්. සභා තීන්දුවක් ගත්තානේ. පළාත් පාලන කොමසාරිස්තුමාට දන්වලා යවන්නම් සභා තීන්දුව ගැන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභා තීන්දුවක් ගන්න කොට නිලධාරියාට පරීක්ෂණයක් කරලා ඒක තහවුරු කරන්න. නැත්නම් නිලධාරියාට අසාධාරණයක් කරනවානේ අපි. අපි බලන්න ඕන ඒ නිලධාරියා වැඩ කරන්නේ මොන වටපිටාවක් ඇතුලෙද කියලා. එයාට නිදහසට කාරණා කියන්න අවස්ථාවක් තියෙන්න ඕන. ඕනම කෙනෙකුට ඒ අවස්ථාව තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ මෙහෙමයි. අපිට පරීක්ෂණ කරන්න බැහැනේ. අපි පළාත් පාලන කොමසාරිස්ට යැවුවට පස්සේ කරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ලේකම්තුමාට කරන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සාධාරණ නෑ. මම කිසිසේත්ම කියන්නේ නැහැ. ලේකම්තුමා කරන පරීක්ෂණය සාධාරණ නැහැ. එතුමා කරන පරීක්ෂණය සාධාරණ වෙන්නේ නැහැ. ඒක හින්දා පළාත් පාලන කොමසාරිස්ට යවනවා. එතනින් ඕන පරීක්ෂණයක් කරයි. ලේකම්තුමාට කරන්න දෙන්න බැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එතුමාට නිවැරදි තීන්දුවක් දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමාට මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා සභාවට ඉදිරිපත් කරන්න කියන්න. එහෙම නැතුව කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක එච්චර දුරට යන්න දෙයක් නැහැ. එතුමාත් මගෙන් ඉල්ලීමක් කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නිලධාරියෙක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන කොට එතුමාට අවස්ථාවක් ලබා දෙන්න ඕන. අපි නිකං මෙතන කතා කරලා ඉවර වෙලා, නිලධාරියාව විවේචනය කරලා ඉවර වෙලා, එහෙම තනි තීන්දු ගන්න බැහැ. ඒක සදාචාරාත්මක නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සාදාචාරාත්මක තමයි. මොකද සභාපතිවරයාට බලතල තියෙනවා අදාළ නිලධාරියා සමග වැඩ කරන්න බැරිනම් එයාව යවන්න. දැන් මම ඒ තීන්දුව ගන්නේ නැහැ. සභාව විදියට දැන් යෝජනාව ස්ථිර වෙලා තියෙනවා. පළාත් පාලන කොමසාරිස්ට යවනවා ඔය පිළිබඳව. එතුමා ගන්න තීන්දුවට අපි එකගයි. එතුමාත් මගෙන් ඉල්ලලා තියෙනවා එතුමාට ස්ථාන මාරුව යන්න අවසර ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා නිලධාරියාව අපහසුතාවයට පත් කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා ඉල්ලලා තියෙනවා මගෙන්. එතුමාට මම කියනවා සභා තීන්දුවකුත් තියෙනවා කියලා. ඔබතුමා ඒ තීන්දුව ගන්න කියලා. විරුද්ධ නෑනේ කවුරුවත්.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ අහන්න. ඔබතුමා පොඩ්ඩක් සභාව මෙහෙයවලා අපිට කතා කරන්න ඉඩ දෙන්න. ඊට පස්සේ කියන්න ඕන දෙයක්. මම නම් විශ්වාස කරනවා මේක නරක පූර්වාදර්ශයක් කියලා. දැන් ඔබතුමා එක වෙලාවක කිව්වා මේ තුන්දෙනාම මාරු කරන්න ඕන කියලා. මම හිතනවා ඒකනම් කමක් නැහැ කියලා. තුන් දෙනාම දැන් හිටිය කාලය ඇති මාරු කරන්න ඕන. මොකද හේතුව මේක මෙහෙම කරන්න ගියාට අපිට බලතල තියෙනවාද මේ නිලධාරීන්ව මාරු කරන්න. මේ නිලධාරීන් හොඳ නැහැ කියලා කිව්වත් වැඩි කැමැත්තක් අරගෙන ඉවර වෙලා, අපි කියනවා මේ නිලධාරියා හොඳ නැහැ මේ නිලධාරියාව යවන්න ඕන කියලා. ඒ ක්‍රමය එහෙම හොඳ දෙයක් නෙමෙයි. ඊළගට එකක් තියෙනවා බොහොම පැහැදිළිව දැන් මම දන්නවා එතුමාට රාජකාරි කරන්න හම්බ වුණේ නැති ඒවා තියෙනවා. දැන් බලන්න ලබුදූවේ පන්සල ගාව තියෙන අර ආමි එකේ වැඩ කරන මහත්තයලාගේ ගෙවල් ගාව ප්‍රශ්නය. දැන් ඒකේ තාක්ෂණ නිලධාරි නිර්දේශ කරපුවා නෙමෙයි කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් ඇයි බිල් දාන්නේ. ඇයි බිල් ගෙවන්නේ. කවුද අධීක්ෂණය කරේ. අපි ගෙව්වේ තාක්ෂණ නිලධාරි නිර්දේශ කරපු බිල්. අනේ මේ අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා විහිළු සපයන්න එපා. මම කියන්නේ තාක්ෂණ නිලධාරි අත්සන් කරන්නේ නැතුව කොහොමද බිලක් ගෙවන්නේ. හරි දැන් කියන්න ගියපු එක කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මොකක්ද ඉන්න අනිත් නිලධාරීන්ගේ රාජකාරිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්න මොකක්ද වෙලා තියෙන්නේ. කියපු ප්‍රශ්නය කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් අර කාණුව කවදාවත් නැති ප්‍රශ්නයක් මතු කරලා තියෙනවා. ළිඳකට වතුර යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද මතු කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ හදපු අය. මෙච්චර කල් ගලා ගෙන ගියපු විදියට නෙමෙයි හදලා තියෙන්නේ. කාණුව වහලා දාලා අනිත් පැත්තේ ඉදන් බැරියර් එකක් දාලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ගිහින් බැලුවද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ගිහින් බැලුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහෙද බැම්මක් දාලා තියෙන්නේ. කොහෙද කාණුවක් වහලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මට කියන්න තාක්ෂණ නිලධාරිතුමා කාණුව කොහෙන්ද දාන්න කියලා තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද එතන කාණුවක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මම කතා කරාට පස්සේ කතා කරන්න කරුණාකරලා. මම අහගෙන ඉන්නම්. මම කියන්නේ තාක්ෂණ නිලධාරි දීපු නිර්දේශ තියෙනවානේ කාණු එන්න ඕන මෙහෙමයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ කාණුවක් නෑ මන්ත්‍රීතුමා. ඔබතුමා දැනගෙන කතා කරන්න. පාරක් විතරයි තියෙන්නේ. මොනවද මේ කියන්නේ. දැන් යමු බලන්න. ඔහොම චෝදනා කරන්න එපා. සියලුදෙනා යමු බලන්න. කාණුවක් නෑ මන්ත්‍රීතුමා. කාණුවක් නෙමෙයි ඒ. එතුමා ළග ඉඳලා කරේ. මම අහන්න කැමතියි මේ ගරු සභාවෙන් තාක්ෂණ නිලධාරි නිර්දේශයක් නැතුව ගෙවීම් කරන්න පුලුවන්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගෙවීම් කරලා නම් වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං එතුමාට කවුරුවත් බලපෑම් කරලද අත්සන් කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒවා ගෙවපු එක වැරදියි. ඇත්තටම මන්ත්‍රීවරු විදියට තාක්ෂණ නිලධාරි නිර්දේශය දුන්නම ඒකට යන්න ඕන. කවදාවත් නැති ප්‍රශ්නයක් ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර කතාවක් කියන්නේ ඔබතුමා. ඔහොම වැඩ කරන්න බැහැනේ. මේ සියලු මන්ත්‍රීවරු දන්නවා තාක්ෂණ නිලධාරි තමයි ඇස්තමේන්තුව හදන්නේ. ඒ අනුව තාක්ෂණ නිලධාරි ළග ඉඳලා තමයි අදාළ කොන්ත්‍රාත්තුව කරන්නේ. ඊට පස්සේ ඒ කොන්ත්‍රාත් එක සාර්ථක නම් තමයි ගෙවීම් සිදු කරන්නේ. තාක්ෂණ නිලධාරි නිර්දේශය අනුව ගෙවීම් සිදු කරාට පස්සේ තාක්ෂණ නිලධාරිට කියන්න බැහැ මම දන්නේ නැහැ කියලා. එයාට විරුද්ධව පරීක්ෂණයක් කරන්න ඕන එහෙමනම්. අබේසේකර මන්ත්‍රීතුමා මොනවද දන්නේ. කාණුවක් නෙමෙයි මේ. පාරක් කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. එතනදී පාරේ ඇන්ගල් එක එහෙ මෙහේ වෙලා කලින් වතුර බැහැපු තැනින් නෙමෙයි වතුර බහින්නේ වෙනත් තැනකින්. මුලු පාරම කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. අඩි 03 ක 04 ක පාර කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. එතනදී පාරේ ඇන්ගල් එක වෙනස්වෙලා තමයි එහෙම වෙලා තියෙන්නේ. ඒකේ ස්වභාවික ගතිය වෙනස්වෙලා තියෙනවා. ඒකට කවුරුවත් බලපෑම් කරලාවත් මුකුත් නෙමෙයි. අදාළ කොන්ත්‍රාත් එක කරන කෙනයි තාක්ෂණ නිලධාරියි ලග ඉඳලා කරපු වැඩක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඔබතුමාගෙන් ඉල්ලනවා. දැන් ඔය ප්‍රශ්නය ආවම මම තාක්ෂණ නිලධාරියාගෙන් ඇහුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්න හරි දීපු උත්තරය කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දීපු උත්තරය බොහොම පැහැදිලිව මම ඕන තැනක කියනවා. ලියන්න ඒ විදියටම. එතුමා දීපු නිර්දේශ වලට විරුද්ධවයි කරලා තියෙන්නේ කියලා කිවුවා. දැන් දාලා තියෙනවා බැරියර් එකක් එහා පැත්තේ කොනකින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔන්න ඔය ඩබල් ගේම් එක තමයි ඒ නිලධාරියා හැමදාම දුන්නේ. ඔන්න ඔය වගේ නිලධාරියෙක් මේ නිලධාරියා. වහාම මාරු කරන්න ඕන. අපි කිසිසේත්ම දන්නේ නෑ. එතුමා තමයි පාර කෙරෙව්වේ. එතුමා මට කතා කරලා කිවුවම තමයි මම ඒ ස්ථානයට ගියේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මම කියනදේට ඇහුම්කන් දීලා උත්තර දෙන්න සභාපතිතුමා. සභාපතිතුමා නිකං මේවා කර ගන්න ඕන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මහා පුදුම හතර බීරි කතාවක් නේ. මාර කතාවක්නේ මේක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගොඩකන්දේ ටැංකිය වත්ත හන්දියේ ගොඩකිරීමක් කරා. මොකක්ද කරේ ඒකට. සභාපතිතුමත් ගියා ඒක බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගොඩකන්දේ ටැංකිය වත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නවත්වලානේ තියෙන්නේ දැන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ කියන්න. හදලා ගොඩ කරලත් ඉවරයි. දැන් සෙන්ර්ටාස් එක බලන්න. මේ නිලධාරීන් තුන්දෙනාම වැඩ කරලා නෑ ඇත්ත කියනවා නම්. මම මේ කියන්නේ එකෙක් අල්ලගෙන තඩිබාන එක නෙමෙයි. මොකක් හරි නීතියක් තියෙනවා නම් අපිට කමක් නෑ කවුරු ගියත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉදිකිරීම කරලා ඉවරද. අඩිතාලම දාලා ඉවර ඇති. එතනින් එහාට කරන්න දුන්නේ නෑනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ලේකම්තුමා කියනවාලු මුල් ගල් තියා ගන්න දෙන්න කියලා. මේවනේ කතා ඉතිං.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැක්කද නිලධාරීන්ගේ තත්ත්වය. ඔබතුමා ආරක්ෂා කරන නිලධාරීන්ගේ තත්ත්වය දැක්කද. වහාම යවන්න ඕන මේ නිලධාරියාව. අබේසේකර මන්ත්‍රීතුමා සභාවේ තීන්දු ඕන නැහැ. මගේ තියෙන බලතල අනුව මම ඒ නිලධාරියාව ස්ථාන මාරු කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තුන්දෙනාම යවන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඔයිට ඉස්සර වෙලා ඔය කතාව ගැන කතා කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක යවන්න සභා තීරණය වැඩි සම්මතයෙන්. හැබැයි අපි නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක මම ඉතාමත්ම කණගාටු වෙනවා. මම හොඳටම දන්නවා ලබුදූවේ, කුරුන්ද කන්දේ ඔය පාර සම්බන්ධව. ඒ තාක්ෂණ නිලධාරියා ළඟ ඉඳන් සමරවීර කියන කොන්ත්‍රාත් කරන මහත්තයත් එක්ක මේක කරේ. මෙතුමාටත් කිව්වා එයා සම්පූර්ණ අධීක්ෂණය සිදු කරා කියලා. නමුත් සමහර මන්ත්‍රීවරුන්ට කියනවා මම දන්නේ නැහැ කියලා. ඉතා පහත් නිලධාරියෙක්. එයා දන්නේ නැත්නම් කවුරුහරි බලපෑම් කරලද අවසන් ගෙවීම් වලට අත්සන් කරේ. මම මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි මෙයා බබෙක්ද. කුරුන්ද කන්දේ පස් ඇද්දා කියලා සිරිධම්ම විද්‍යාලයට එයා අත්සන් කරේ නැහැ. එයා අත්සන් කරේ නැහැ එයා හිටියේ නැහැ කියලා. දැන් මේක දන්නේ නැතුවද අත්සන් කරේ. කවුද බලපෑම් කරේ. වහාම පරීක්ෂණයක් කරන්න. ඉස්සෙල්ලා ඔබතුමා කරන්න. ඊට පස්සේ පළාත් පාලන කොමසාරිස්ව යවන්න. වහාම කරන්න. මේ දෙබිඩි පිළිවෙත් අනුගමනය කරන නිලධාරීන් එක්ක වැඩ කරන්න බැහැ.

ගිය සතියේ නෙමෙයි කලින් සතියේ උප සභාපතිතුමා කියනවා මේ නිලධාරියා එක්ක වැඩ කරන්න බැහැ කියලා. මෙහේ ඉන්න වෙනත් නිලධාරියෙක්ව දාලා ග්‍රාම සේවා වසම් 04 කින් නිදහස් කරා. අද චනක මන්ත්‍රීතුමා කියනවා එයත් එක්ක වැඩ කරන්න බැහැ කියලා. මම මේ වැඩ කරන්න බැහැයි බැහැයි කියන පලියට ඔක්කොම ටික නිදහස් කරලා දීපන්කෝ නිකං ඉන්න එයාට. ඒ මට්ටමට යන්න බැහැ. කොට්ඨාශවල මන්ත්‍රීවරු එක්ක වැඩ කරන්න බැරි නම් එයා යන්න ඕන. මම මෙතෙක් ආරක්ෂා කරපු එකයි වරද තියෙන්නේ ඒ නිලධාරියාව අද වෙනකම්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** දිගින් දිගටම මේ වගේ ප්‍රශ්න එනවා. හොඳම කතාව කපුහෙම්පලින් පහුගිය දිනක දුරකථන ඇමතුමක් ඇවිල්ලා අනවසර ඉදිකිරීමක් කරනවා කියලා. මෙයා බලන්න ගිහිල්ලා තියෙනවා. මම කමිටුවටත් ගෙන්නුවා. මන්ත්‍රීවරුන්ට දැනගන්න මේ කියන්නේ. ගියාට පස්සේ ප්‍රශ්නය දුර දිග ගිහිල්ලා. ඒ ඉදිකිරීම අසාධාරණ නැහැ. ඒ මිනිස්සු කුදලන් ඇවිල්ලා තාක්ෂණ නිලධාරිගේ ඇඟට. ඇඟට ආවට පස්සේ කියලා තියෙන්නේ මොකක් දන්නවාද, උප සභාපතිතුමා කෝල් කරලා කිව්වා ඒ හින්දයි මම නවත්වන්න ආවේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තනිකරම පාවලා දෙනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මට බොහොම හිතවත් මිනිස්සු. ඒ මිනිස්සු හවස ආවා අපේ ගෙදර. මගෙන් අහනවා උප සභාපතිතුමා මේක නවත්වන්න කිව්වද කියලා. මම බලනවා මේ මොකක්ද කියන්නේ කියලා. ඒ වගේ තුප්පහි වැඩ කරන්න තරම් මම පහත් තැනට වැටෙන්නේ නැහැ. අන්තිමට මම කිව්වා අහවල් දවසට මුදල් කමිටුව තියෙනවා එන්න කියලා. දෙපාර්ශවයම ගෙන්නුවා. තාක්ෂණ නිලධාරියාගෙන් අහන කොට කියනවා මේ කට්ටිය ගහන්න වගේ ආවා ඒ නිසා මම ඔබතුමාගේ නම කියලා ආවා කියලා ඇඟ බේරගෙන. ඔන්න ඔහොමයි මේ තාක්ෂණ නිලධාරීන් උත්තර දෙන්නේ. එක දවසක් දෙකක් නෙමෙයි මේවා වෙන්නේ. චනක මන්ත්‍රීතුමා ඔබතුමා මේක ගේන්න තිබුණේ අවුරුදු දෙකකට විතර උඩදී. මම කණගාටු වෙනවා. මම දිගින් දිගටම කිව්වා. හරිම හිතුවක්කාරයි. කිසිම මන්ත්‍රීවරයෙක් කියන දේකට ඇහුම් කන් දෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. මම මේකත් කියන්න ඕන. මම පොදුවේ දරපු මතයක් තමයි අවුරුදු 05 ට වැඩි නිලධාරීන්ව මාරු කරන්න ඕන. ඒක මූණු බලලා කරන්න බැහැ අහවලා අහවලා කියලා. නමුත් ඒක පොදුවේ මම දරන මතයක්. නමුත් අනිත් නිලධාරීන් දෙන්නා එහෙම නැහැ. ඒකත් මම මේ වෙලාවේ කියන්න ඕන. ඒකට හේතුව මම කියන්නම්. කවදාවත් ඉරිදට දුරකථනයට ප්‍රතිචාරයක් නැති නිලධාරියෙක් මේ. මේක මම වගකීමෙන් කියනවා. මම සමහර වෙලාවන් වලට ඒ අදාළ තාක්ෂණ නිලධාරියාගේ කොට්ඨාශයට ගුණසේකර මහත්තයව යවනවා අනවසර ඉදිකිරීම් නවත්වන්න. අපි ඒවා දරාගෙන හිටියා. උප සභාපතිතුමා ඇවිත් කියන කොට හැමදාම ආරක්ෂා කරා. ගුණසේකර මහත්තයා ගිහිල්ලා නවත්වපු තැන් තියෙනවා. එතුමා බැහැයි කියනවා. මට අදාළ කොට්ඨාශය නෙමෙයි කියනවා. මම කියනවා ඔබතුමා තාක්ෂණ නිලධාරියෙක් වන්නේ බෝපෙ පෝද්දලට. එක කොට්ඨාශයකට නෙමෙයි. මම වගකීම පවරන්නේ කරුණාකරලා ගිහින් නවත්වන්න කියලා. එහෙම ගිහින් නවත්වනවා ඒ නිලධාරීන්. නමුත් මේ නිලධාරියා තමන්ගේ කොට්ඨාශයේ ඒ කටයුත්ත කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, එතුමා ස්ථාන මාරුවක් ඉල්ලුව නිසා මෙහෙන් යන්න අනුමැතිය ලබා දෙන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාචිකව ඉල්ලුවේ මගෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් මේ යෝජනාවක් ගෙනාවානේ. ඒ යෝජනාව සම්මත වුණා නම් අපි ඒකට විරුද්ධයි. ඒකට පරීක්ෂණයක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කොහොමත් දන්නවා ඔබතුමා මේකට විරුද්ධයි කියලා. ඔබතුමාට මේකේ ප්‍රශ්න ඇති කරන්න සියලු තොරතුරු දෙන්නේ ඔය නිලධාරියා. ඇත්ත කතාව ඒක. ඔබතුමා විරුද්ධ බව අපි කොහොමත් දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් අපිට මේ පාරවල් පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කියන්න දැන් ඔය අනිත් නිලධාරීන් දෙන්නා කරලා තියෙනවද එකක්වත්. දැන් අපි මහජන නියෝජිතයෝ විදියට ප්‍රශ්න ඉදිරිපත් කරලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් අබේසේකර මන්ත්‍රීතුමා අනිත් නිලධාරීන් දෙන්නා දෙයක් කිවුවම මැදිහත් වෙනවා. මේ වගේ ගේම් ගහන අය නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක්ද ගේම් ගහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාපතිවරයා අපහසුතාවයට පත් කරන්න, ආයතන ප්‍රධානියාව අපහසුතාවයට පත් කරන්න මන්ත්‍රීවරු එක්ක කුමන්ත්‍රණ කරන එක ගේම් ගහනවා නෙමෙයිද. ඒවා සද්භාවයෙන් කරන දේවල්ද. ප්‍රශ්නයක් තියෙනවා නම් සභාපතිවරයා එක්ක කතා කරලා විසඳගන්න තිබුණා. ඔය සම්බන්ධව මාත් එක්ක ඔය නිලධාරියා ඔය කිසිම දෙයක් කතා කරලා නැහැ. ඔය ගොඩකන්දේ ප්‍රශ්නයේදී මම කියලා තමයි ගිහින් නැවැත්තුවේ. එතන ගොවිජන සේවා එකෙන් ලියුම් ගෙනල්ලා තියෙනවා. එතන අඩු පහත්බිම් එකේ අවසරය විතරයි. ගොවිජන සේවා එකෙන් දීලා තියෙනවා කුඹුරු ඉඩමක් නෙමෙයි කියලා. ඉතිං ඒකෙදි අප අත්තිවාරම දාන එක නැවැත්තුවා. නවත්වන්න පුලුවන් තැනදී නැවැත්තුවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මම තමයි මේ ප්‍රශ්නය මතු කරේ දැන්. බෝලේ උඩ දැම්මම කට්ටිය ගහනවා හතර වටේටම. මට දැන් තියෙන යෝජනාව මෙහෙමයි. ප්‍රශ්නයක් ඇති වුණානේ. සභාවේ තීන්දුවක් විදියට අපි ගමු. ලේකම්තුමා පරීක්ෂණයක් පවත්වන්න. ඒ පරීක්ෂණ වාර්තාවත් එක්ක කොමසාරිස්තුමාට යවමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා සභා තීන්දු ඕන නැහැ. මුකුත් ඕන නැහැ. මම මගේ තීන්දුව ගන්නම්. ඒ බලතල මට තියෙනවා. ඒ අනුව මම කටයුතු කරන්නම්. හේතුව වෙන මුකුත් නෙමෙයි. අනිත් නිලධාරීන් දැන ගන්න ඕන. ආයතන ප්‍රධානියයි, ප්‍රධාන රාජ්‍ය නිලධාරියයි දෙන්නම තැන තැන විවේචනය කරන නිලධාරීන් එක්ක වැඩ කරන්න බැහැ. ඒකයි හේතුව. සභා තීන්දු ඕන නැහැ. මම ක්‍රියාමාර්ග ගන්නම්.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එතෙක් වෙන තාක්ෂණ නිලධාරි කෙනෙක් ලබා දෙන්න වැඩ කරන්න. නැත්නම් කරන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කට්ටියට රිදෙයි. සමහරුන්ට රිදෙයි. නමුත් කේලම් කියාගෙන යන්නේ නැතුව ප්‍රශ්නයක් තියෙනවා නම් මාත් එක්ක කතා කරන්න ඕන. නැත්නම් ලේකම් මහත්තයත් එක්ක කතා කරන්න ඕන.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යයි මට ඒ කාරණය සම්බන්ධයෙන් ඒක මගේ කොට්ඨාශයේ ගැටලුවක් නිසා. ඔය පාර අඩි තුනට සභාවෙන් තමයි කොන්ක්‍රීට් කරේ. තාක්ෂණ නිලධාරි කොන්ත්‍රාත්කරුවත් එක්ක ගිහින් සියලු දේවල් බැලුවා. අබේසේකර මන්ත්‍රීතුමාට ලියුම ලබා දීපු කෙනාගේ ගෙදරට මෙහා පැත්තෙන් කුරුන්දෙන් එන වතුර පාර, පාරට ආවා. අපි පාර කොන්ක්‍රීට් කරාට පස්සේ කන්දේ ඉඳලා එන වතුර පාර, මාර්ගය හරහා ඇවිල්ලා අනිත් පැත්තේ ඉඩමට ගිහිල්ලා තියෙන්නේ. එතකොට දැන් ඒක වළක්වන්න කොහොමටවත් බෑ. අබේසේකර මන්ත්‍රීතුමා ලියුම එවපු පලියට තමන්ගේ වැරැද්දක් තියෙන කෙනා කවදාවත් මම වැරදියි කියලා කියන්නේ නැහැ. ඒ මනුස්සයා ඕතන කරලා තියෙන දේවල් සියලුම දෙනාට ගිහින් බලාගන්න පුලුවන්. වතුර පාර ආපු එක කවුරුවත් හිතාමතා කරපු දෙයක් නෙමෙයි. කන්දෙන් එන වතුර පාර කොහොමත් පහළට තමයි යන්නේ. කන්ද උඩට යන්න විදියක් නැනේ. අනිත් කෙනාගේ ගෙදර මිදුලෙන් තමයි එන්නේ. ඕකට අපිට සභාවෙන් විසඳුමක් දෙන්න ඉස්සෙල්ලා එයා මොකක්ද කරේ කියලා සියලුම දෙනා අද ගිහින් බලන්න. අපි සභාවේ මුදල් වියදම් කරලා මේක කරේ. මම මේ ගැටලුව දුර දිග යන හින්දා ඇත්තටම කිවුවේ නැහැ. සභාවේ මුදල් වියදම් කරලා හදපු පාරට ඔය කියන බ්‍රිගේඩියර් බම්පර් එකක් දාලා. එයාගේ මහත්මා ගතිය ඒකෙන් හිතා ගන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයත් නීතිවිරෝධි වැඩක් කරලා තියෙන්නේ. බම්පර් එකක් දාලා තියෙනවා මේ කියන පුද්ගලයා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** කවුද ඒකට වග කියන්නේ. එච්චර ලොකු වැරැද්දක් එයා කරලා තියෙනවා. ඒකට සභාවෙන් තීරණයක් ගන්න ඕන. අපි සල්ලි වියදම් කරලා හදපු පාරට එයාට ඕන ඕන විදියට බම්පර් දාන්න දෙන්න බැහැ. එතකොට මේ තරම් වැරැද්දක්, ප්‍රශ්නයක් එයාගේ අතේ තියාගෙන මට කිව්වලු දේශපාලන ගැටලු කියලා. අපිට දේශපාලනය වැඩක් නෑ. එයා යූ. එන්. පී. වුනාට මට ඒක වැඩක් නැහැ. එච්චර වැරැද්දක් කරලා තියෙන්නේ. අපි හදපු පාර විනාශ කරාට එයාට ගන්න විසඳුම මොකක්ද. මම හිතනවා සියලුම මන්ත්‍රීවරු ඒකට තීරණයක් ගන්න ඕන කාරණයක් කියලා. දැන් ඒ පාරේ බයිසිකලයක්වත් හදිස්සියකට යන්න බැහැ අර බම්පර් එක හින්දා. බම්පර් එකක් පාර හරහා දාලා එයාගේ ඉඩමට වතුර යන එක නවත්වන්න. ඒ ගැන තීරණයක් ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ මනුස්සයාගේ ළිඳ ආරක්ෂා කරලා දෙන්න.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ළිඳට වතුර යන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එනවානේ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එක දවසක්වත් වැස්සේ නෑ ඕක හැදුවට පස්සේ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා. උඩ ඉඳන් එන වතුර පාර කොහොමත් පහළ පැත්තට යනවා. එහෙමනම් කලින් වතුර ගියපු තැනත් වැරදියි. මේ තැනත් වැරදියි. කලින් ගිය තැනත් අනවශ්‍ය දෙයක් වෙලා තියෙන්නේ. දැන් ඒක වෙනස්වෙලා තියෙනවා නම් ඒකෙන් අනවශ්‍ය දෙයක් වෙලා තියෙන්නේ. මම කියන්නේ නම්, මම ඉන්න මතය තාක්ෂණ නිලධාරීට තියෙන දැනුම අපිට නැහැ. එතුමා ඒක අධීක්ෂණය කරා නම් කොහොමද එහෙම වෙන්නේ. එතුමාට කියන්න පුලුවන්ද අවසන් බිල් එකටත් අත්සන් කරලා මම මේක දන්නේ නැහැ කියලා. එතුමාගේ අධීක්ෂණයෙන් තොරව කරානම් ඒක සම්පූර්ණ වැරැද්දක්නේ.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>**(ඊ) කාරක සභාවල වාර්තා**</u>

<u>**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2020.02.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- II.** 2020.03.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-03-10 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-03-10 දින පැවති නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**04. පරිසරය සහ පහසුකම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-03-10 දින පැවති පරිසරය සහ පහසුකම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ-**

**I. 2019-12-31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-12-31 දිනට අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**(උෟ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ මාර්තු මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ගිය සභා වාරයේදී අපි අනවසර ඉදිකිරීමක් සම්බන්ධව තාක්ෂණ නිලධාරීන් යවලා බැලුවා. දැන් ඒකේ මේ වෙනකොට තත්ත්වය කොහොමද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් සම්බන්ධවද.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** උක්වත්තේ ලවණ බාධකය අසල එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නවත්වලා තියෙනවා. එයාට අනුමැතියට ඉදිරිපත් කරන්න කියලා උපදෙස් ලබා දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අනවසර ඉදිකිරීම් සම්බන්ධව අබේසේකර මන්ත්‍රීතුමා හැමදාම කතා කරනවා. ඒක කිවුවේ විවේචනාත්මකව නෙමෙයි. හපුගල දහනායක කියන කෙනා බොහොම පොඩියට පටන් ගත්තේ. අද වෙනකොට බලන්න මහා පරිමාණයෙන් පාර අයිනටම ගොඩ කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාව කැඳෙව්වා. ඒක කුඹුරු ඉඩමක් නෙමෙයි කියලා තහවුරු කරන්න කිවුවා. ඒක කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** තුන්වෙනි තට්ටුවෙත් වැඩ පටන් අරගෙන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියුම ගහලා තියෙන්නේ මම ලියුම අත්සන් කරා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** තුන්වෙනි තට්ටුවෙත් වැඩ පටන් අරගෙන. කන්ටේනර් අංගනයක් විදියට ලොකු වැඩ කොටසක් යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනිවාර්යයෙන්ම ගන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඇත්තටම ප්‍රගතියට අද කතා නොකරන්න හිතන් හිටියේ. නමුත් නිකං හරි කියන්න ඕන අපිට ඊළඟ සභාවට හරි දෙන්න. මේ නඩු දානවා කියන එක නාගරික සංවර්ධන අධිකාරියටයි, මෙහෙටයි නිකං මාරු කර කර ඉන්නේ නැතුව අද වෙනකම් මෙන්න මේ නඩුව දැම්මා, මෙන්න මෙදාට තියෙනවා කියන මට්ටමට දෙයක් වෙලා නෑනේ අවංකව කිවුවොත්.

දැන් ඔබතුමා බලන්න මේ දේවල් වෙන අතරේ ටෙක්ලා මන්ත්‍රීතුමිය බොහොම පැහැදිළිව ඉදිරිපත් කරා දහනායක එක ළඟම, එතනින් ටිකක් එහා අනිත් පැත්තට යනකොටම වහලා තට්ටු දෙකට විතර දැන් බිල්ඩින් එකත් හදලා ඉවරයි.

ඊළඟට එදා ප්‍රියන්ත මන්ත්‍රීතුමයි, මමයි බලන්න ගියා. රංගනී මන්ත්‍රීතුමියලා, ඔබතුමන්ලා ඔක්කොම දැක්කා. තාක්ෂණ නිලධාරිතුමියත් බලන්න ගියා. ඇත්තට මේ දේවල් අපිට කියන්න බැහැ නොදැන කරනවා කියලා. මේවා දන්නවා. සභාවේ දැනුවත්ව තමයි මේවා කෙරිලා තියෙන්නේ. බොහොම පැහැදිළිව සභාව දැනුවත්. අපිට එහා කොනේ ඉඳලා ආරංචි එනවා නම් ඇයි දෙයි හාමුදුරුවනේ මේකට ආරංචිය එන්නේ නැත්තේ මෙච්චර බිල්ඩින් තොගයක් හදාගෙන යන කොට. සභාව විදියට මේක මෙහෙම වෙන්නේ නැත්නම් වැඩක් නෑ. දැන් බලන්න යන්න ඊරියගහ හන්දියේ අර වෙන්දේසි කරපු ඉඩම. දැන් බලන්න ගිහිල්ලා පාරේ යන්න පුලුවන්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන ඉඩමෙද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාප්ප කඩා ගෙන ගිය ඉඩමේ. ඒකේ උඩට යන්න බලන්න. තාම අවුරුදු පහ නෙමෙයි වෙන්දේසියවත් ඉවර නැහැ. පාරේ යන්න බැහැ. ගල් ගැලවිලා. දැන් බලන්න ඔය මොකක්වත් ඕන නැහැ. අර තට්ටු තුනක බිල්ඩින් එකක් හැදුවා කවුරුවත් දන්නේ නැහැ. ඒ මනුස්සයට අසාධාරණයක් දැන් මේ කරන්නේ. නමුත් එකක් තියෙනවා අපේ තාක්ෂණ නිලධාරීන්ගේ තියෙන වැරැද්දක් මේ. ඒ කියන්නේ මේ අය මුලින් කිවුවා නම් වැරදියි කියලා ඔහොම වෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මම ඔබතුමාට උදාහරණයක් කියන්නද. දැන් ඔබතුමා ආරක්ෂා කරනවා ඔය නිලධාරියාව. චනක මන්ත්‍රීතුමාගේ කාරණා තුනක් සම්බන්ධව මම මේ සභාවේ කියලා තියෙනවා නඩු දාන්න. මම මේ සභාවේ කියලා තියෙනවා. ඉතිං එතුමා එපැයි ලේස්ති කරන්න. එතුමා ඒක හදලත් නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවා, විශේෂයෙන්ම මේ නිලධාරි මහත්මයා දන්නවා ඔබතුමා නොදැන හිටියත්. නිලධාරියෙක් විදියට දැන ගන්න ඕන. මේකට යන ක්‍රියා පටිපාටියක් තියෙනවා රාජ්‍ය සේවකයෙකුට. නිකං එක පාරට ඔබතුමාට මාරු කරන්න කියලා නෙමෙයි කියන්නේ. ඉස්සෙල්ලා ඔබතුමා දාන්න පේපර් එකක් මෙහෙම වැඩ කරලා නෑ කියලා හරියට. ඊළඟට පරීක්ෂණයක් ඉල්ලලා දාන්න. එහෙම ඕන කරන්න. ඇත්තටම එකක් තියෙනවා මේ නිලධාරීන් තුන්දෙනාම වැඩ කරලා නෑ නිකං කිවුවොත් එහෙම. මොන හේතුව නිසා හරි ඔබතුමා නිවැරදි තැනක හිටියා මේ තුන්දෙනාම දැන් යන්න ඕන කියලා. ඒක තමයි ඇත්ත. අඩුගානේ දැන් යනකොට පාලමෙන් මෙහා පැත්තේ තියෙන ජස්ටින්ලාගේ ගරාජ් එක කාලයක් තිස්සේ මේවා වෙනවා. මේ සභාවට අපි දන්වලා තියෙනවා දුරකථන ඇමතුම් දීලා. හැබැයි කිසි දෙයක් කරන්නේ නැහැ කියලා මේ සභාවට දන්වලා තියෙනවා අපි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ගිය සභාවේදී අපේ තාක්ෂණ නිලධාරිතුමිය බලන්න ගිහිල්ලා ඇවිත් කිවුවනේ උක්වත්තේ පාලම ළඟින් ඇතුලට ගියාම තියෙන එක ගැන. දැන් ජස්ටින් ඇවිල්ලා අපිට බොහොම පැහැදිළිව කියනවා දුරකථනයෙන් කිවුවලු. හැබැයි මේ සභාවෙන් ගන්න කිසිම ක්‍රියාමාර්ගයක් නැහැලු. එතකොට මෙන්න මේක කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජස්ටින්ව උදාහරණයට ගන්න එපා. වෙන කෙනෙක්ව ගන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔබතුමා බලන්න මේකට ඔබතුමාට කිසිම කතාවක් නැතුව ක්‍රියාමාර්ග ගන්න පුලුවන් එකක්. වතුර ටැංකිය පාරේ වෙන්දේසි ඉඩම ගැන මම දිගින් දිගට කියනවා. අඩු ගානේ අර ඉඩම් කෑලි විකුණන එක දැනට හරි නතර කරන්න ඕන විකුණන්න එපා කියලා. බැනර් දාලා විකුණනවා වතුර ටැංකිය පාරේ ඉඩම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇක්සස් එක නෙමෙයි නේද ඔය කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇක්සස් එක නෙමෙයි ඊට මෙහා එක. ඒකට ඔබතුමා අදාළම නැනේ. නාගරික සංවර්ධන අධිකාරියෙන්නේ දුන්නේ. බලන්න ඒකේ පරිසර වාර්තාවක් අරන් නෑ. එන්.බී.ආර්.ඕ. වාර්තාවක් අරන් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක නැවැත්තුවානේ. විශේෂ සභාවේදී තීන්දු ගත්තානේ. අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි. විශේෂ තීන්දු ගත්තානේ විශේෂ සභාවක් කැඳවලා. ඒවා ක්‍රියාත්මක කරන්න. අඩුම තරමේ ඒ ටික ක්‍රියාත්මක කරන්න. අපි විශේෂ සභාවේ තීන්දු ගත්තා නේ. ඒ ටික කරන්න කියන්න ඉස්සෙල්ලා. නැත්නම් ඔය කට්ටිය ඔක්කොටම යන්න ලැස්ති වෙන්න කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කියන්න කරුණාකරලා එක එක්කෙනාට පුද්ගලිකව අදාළ භාරදීපු නිලධාරීන්ගෙන්. අපි බලපෑම් කරනවා නම් කමක් නෑ. බලපෑම් කරනවා නම් සද්ද නැතුව ඉන්න පුලුවන්. අපි කිසිම කෙනෙකුට බලපෑම් කරලා නෑ වැඩ නවත්වන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තුන්දෙනාටම ලියුමකින් දැනුම් දෙන්න. ඒ විදියට කරන්න එතකොට. දැනට හරි තරංගා ලෑන්ඩ්ස් වල අර කන්ද මුදුනේ බොහොම පැහැදිළිව ඉල්ලුමට ඒ අය දෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මටත් දැන් ඔය වචනය පුරුදු වෙලා. නිතරම කියවෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ''බොහොම පැහැදිළිව''

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං බොහොම පැහැදිළිව කියලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක දැන් මට කටපාඩම් වෙලා අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් බොහොම පැහැදිළිව ලිඛිතව දීලා තියෙනවා. ඒ කියන්නේ මේ ඉඩමට බලන්න ඇවිල්ලාවත් නෙමෙයි අවසර දීලා තියෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්. එහෙම එකක් තියෙන්නේ. ඊළඟට එකක් තියෙනවා මොනවද මේ වරලත් ඉංජිනේරුවෝ දෙන සහතිකය. ඒකෙන් වැඩක් තියෙනවද. ඕකට අපි විකල්ප තීන්දු තීරණ ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපි අඩුවක් කරන්නේ කොහොමද වරලත් ඉංජිනේරුවෝ දෙන සහතිකයකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිළිව මගේ ළඟ තියෙනවා විස්තර. මම ඕනනම් දෙන්නම්. වෙනම බලන්න. දැන් කමිටුව රැස් වෙන්නේ නෑනේ. බොහොම පැහැදිළිව වරලත් ඉංජිනේරුවෝ දීලා තියෙනවා සහතිකය නියමිත ප්‍රමිතියට හදලා තියෙනවා කියලා. ඉතිං ප්‍රමිතියට හදලා තියෙනවානම් මාස 03 ක් 04 ක් යන්න ඉස්සෙල්ලා ඉවර වෙන්න පුලුවන්ද. බොහොම පැහැදිළියි කියන දේ. පැහැදිළිව දීපු එකක් මේ. ලිඛිතව දීලා තියෙනවා. වරලත් ඉංජිනේරුවෝ සහතිකය දීලා තියෙනවා ප්‍රමිතියට කරලා තියෙනවා කියලා කාණු ටික, පැති බැමි ටික, පාරවල් ටික. එකින් එක වෙන් වෙන්ව දීලා තියෙනවා. මාස කීයද ගිහින් තියෙන්නේ කැඩිලා ගිහිල්ලා. පාරවල් නැහැ. ඔබතුමා ගොඩවෙන්න අර ඊරියගහ හන්දියේ එකට. ඒකට ගොඩවෙච්ච තැනනේ. යන එන ගමන් ගොඩවෙලා බලන්න. පාරේ මොකක්ද තියෙන්නේ බලන්න. මොන බොරුවක්ද තියෙන්නේ බලන්න. වැඩක් නෑ. දැන් ඊට පස්සේ වෙන්නේ මේ අය පදිංචි වෙනවා. ඊට පස්සේ ඡන්ද දායකයෝ ඇවිල්ලා කියනවා අනේ මන්ත්‍රීතුමා මේ පාර කැඩිලා හදලා දෙන්න කියලා. ඊට පස්සේ ඔබතුමා වෙන තැනකට දාන්න තියෙන ප්‍රතිපාදන දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අබේසේකර මන්ත්‍රීතුමා ඒකත් බැලුවේ අහවල් නිලධාරියා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඇයි ඔහොම කියන්නේ. මට ඒ නිලධාරියාද, මේ නිලධාරියාද කියලා කතාවක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක තමයි කියන්නේ. ඒ වැඩේ වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ වැඩේ වෙන්නේ නැත්නම් කරන්න ඕන දේ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරන්න ඕන දේ තමයි දැන් කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කරන්න ඕන දේ ඔබතුමා ඊට ඉස්සෙල්ලා කිවුවා. මේ තුන් දෙනාම වැඩ කරලා නැහැ මොන හේතුවක් නිසා හරි. අපි දන්නේ නෑ හේතුව මොකක්ද කියන්න.

මේ ඇවිත් සන්තෝෂ වෙන්න ඕන කාරණයක්. අසිත තවුසා වගේ. හිනාවෙලා අඬන්න බෑ. එක දේකට නම් සන්තෝෂ වේවි. තමුන්නාන්සේලා අපිත් එක්ක එකට හිටියා මොන පක්ෂයේ හිටියත්. අපේ කියාස් මන්ත්‍රීතුමා ඉදිරි කාලයේදී එක්සත් ජාතික පක්ෂයෙන් නෙමෙයි ටෙලිෆෝන් එකෙන් ඡන්දය ඉල්ලනවා. ඒ නම මතක නැහැ. මේක විහිලුවට ගනිපු දෙයක් නෙමෙයි. සමගි ජන බල වේගයෙන් ඡන්දය ඉල්ලනවා. අපි ඉතිං සුභ ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම අපේ සහෝදරිය, ශ්‍යාමිකා මන්ත්‍රීතුමිය මම දැනට නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය ඉල්ලනවා. අපි සුභ ප්‍රාර්ථනා කරනවා. හැබැයි කියාස් මන්ත්‍රීතුමා මෙතන නැති නිසා මේක කියන එකත් හොඳ නැහැ. හැබැයි එකක් තියෙනවා සභාපතිතුමා එක්ක ගිහින් කතා කරලා, කරා වගේ වැඩ නම් කරන්න එපා. විරුද්ධ පක්ෂය නම් විරුද්ධ පක්ෂයේ. ආණ්ඩු පක්ෂය නම් ආණ්ඩු පක්ෂයේ. එහෙම යන්න ඕන. ඒ වගේම ඔබතුමියට එකක් කියන්න තියෙනවා. අපි බලාපොරොත්තු වෙනවා හොඳ මිහිරි කටහඬක් තියෙනවා. අදහස් තියෙනවා. ඉගෙන ගෙන තියෙනවා. බුද්ධිමත් ඒ සියල්ල තියෙනවා. හැබැයි දෙපාරයි කතා කරලා තියෙන්නේ මේ සභාවේ මේ කාලයටම. හැබැයි පාර්ලිමේන්තුව ගියාම එහෙම බැහැ. පාර්ලිමේන්තුව පැත්තක තියන්න. ඊළඟ ඉලක්කය පළාත් සභාව. අපි ප්‍රාර්ථනා කරනවා ඒ තැනට යන්න. හැබැයි කතා කරන්න හරි වැරදි ගැන දන්න එකේ. ඔක්කොම ඔලුවේ තියාගෙන ඉන්න එපා. ඔලුව බර වෙනවා නැත්නම්. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් සතුටුම ආරංචිය කිවුවේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හිතනවා ඉතාම ඉක්මනින් මාව මෙතනින් පන්නයි කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔබතුමා මොන පක්ෂයද නියෝජනය කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එක්සත් ජාතික පක්ෂය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් පන්නන්න හම්බවෙන්නේ නැහැනේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතියේදී කරුණු කීපයක් කතා කරන්න ඕන. අර අපේක්ෂක දෙපලට අපි සුභ පතනවා පාර්ලිමේන්තුව දක්වා යන්න ශක්තිය ධෛර්ය ලැබෙන්න කියලා. ඊළඟ කරුණ තමයි ගරු සභාපතිතුමනි, කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ ජල ප්‍රශ්නයක් තියෙනවා. ජල ටැංකියක් ගේන්න මාස ගාණකට කලින් යෝජනා කරා. තාම ජල ටැංකිය සවි වෙලා නෑ සභාපතිතුමනි. මේ කාලයේ අත්‍යාවශ්‍ය දෙයක් විදියට තාම සවි වෙලා නෑ. සභාපතිතුමා කිවුවා ආයේ කියන්න දෙයක් නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකම වැරැද්ද තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකේ වැඩේ වෙලා නෑ සභාපතිතුමා. තදබල ලෙස අවශ්‍යතාවයක් තියෙනවා. ඒක ඉක්මන් කරලා සවිකරලා දෙන්න. තාම නාමපුවරුවත් සවි වුණේ නෑ. ඒකත් ඒ එක්කම සවි කරලා දෙන්න.

ඊළඟ දේ තමයි ගරු සභාපතිතුමා කපුහෙම්පල සල්මල් උයනේ ෆිනෑන්ස් ඉඩමත්, සුගුණ මාවතේ ෆිනෑන්ස් ඉඩමත් අපේ කාල සීමාවේදී නෙමෙයි කරේ. කොමසාරිස් පාලන කාලයේදී විකුණපු ඉඩම්. තාම ඒ ගිවිසුම් කාලය තියෙනවා. ඒ පාරවල්වල බලු බල්ලෙකුට යන්න බැරි මට්ටමට කැඩිලා. මම ගිහින් කතා කරාම කිවුවා සභාවට දැනුම් දීලා තියෙනවා කියලා. ඒක නැවත ඒ ආයතනයෙන් දැනුම් දෙන්න ඕන. කාල සීමාව තියෙනවා. ඊරියගහඳුව පාර තව පාරක්. ඒ පාරවල් ගැන සභාවට දැනුම් දීලා තියෙනවා ඒ ඉඩම්වල ඉන්න ගෙවල් හිමියන්. නමුත් ඒ වැඩේ වෙන්නේ නෑ සභාපතිතුමනි. මොකද දන්නේ නෑ ඒකේ තත්ත්වය. අපිට සභාවකින් කරන්නත් බෑ. අවුරුදු පහේ ගිවිසුම් කාල සීමාව තියෙනවා. ලබන අවුරුද්දේ තමයි සල්මල් උයනේ ගිවිසුම් කාලය අවසන් වෙන්නේ. නමුත් ඒ වැඩේ වෙන්නේ නෑ. ඒ අය මග අරිනවා. කාල සීමාව පන්න ගන්න හදන්නේ. ඒ ෆිනෑන්ස් ඉඩම් තුනටම මාර්ග පද්ධති සකස් කරන්න කියලා ඉල්ලීම කරන්න ඕන. සුගුණ මාවත, සල්මල් උයන, ඊරියගහඳුව පාර සඳහා ඒ දැනුම්දීම කරන්න.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාවක් විදියට තිබුණා ජන සභා ගොඩනැගිල්ල පින්තාරු කිරීම කියලා. ඒක හොඳ යෝජනාවක්. ඒ වගේම මම මීට ඉහත දෙපාරක් විතර යෝජනා කරා වැසිකිළිවල උතුරන තත්ත්වයක් තියෙන නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගලියක් දාලා අයින් කරානේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගලියක් දාලා අයින් කරාට නම් ඒක ස්ථාවර විසඳුමක් වෙන එකක් නම් නැහැ. මොකද නැවතත් ඒ ටිකම වෙනවා වහින කාලය වෙන කොට. ඒ නිසා මේකට සුදුසු තාක්ෂණ නිලධාරියෙක් යොදවලා බලන්න. මේකේ වෙන්නේ වැසිකිළිවලේ වතුර නැවත අනිත් පැත්තට එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම වෙන්නේ ඕක වෙල් මට්ටමේ තියෙන නිසා වෙන්න ඇති වැහිකාලයට.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** දැන ගන්න තියෙනවා උඩහින් එන වතුර පාරක් එයාලා හිරකරගෙන තාප්පයක් බැඳගෙන කියලා. එහෙම තොරතුරකුත් තියෙනවා. පිටිපස්සේ තියෙන ගෙවල්වලින් එන ඒ වතුර හිර වුණාම ඒ වතුර මේකට උරාගෙන බැහැලා යනවා. මට මේක පැහැදිළි නෑ මොකක්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාක්ෂණ නිලධාරි එක්ක පරීක්ෂා කරලා බලන්නම්.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** කොහොම හරි සුදුසු තාක්ෂණ නිලධාරියෙක් යවලා පොඩ්ඩක් බලලා ඒකට විසඳුමක් ගන්න. පළාතේ යන්න බැහැ සභාපතිතුමනි වහින කාලයට. පුදුමාකාර දුර්ගන්ධයක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේ ඉල්ලීමක් කරන්න ඕන. අපි කමිටුවක් දා ගත්තා අනවසර ඉදිකිරීම් හා වෙන්දේසි ඉඩම්වල සභාව සතු දේපල පිළිබඳව නැවත සමීක්ෂණයක් කරලා ඒකට මැදිහත් වෙලා ක්‍රියාත්මක වෙන්න. ඒකට අදාළව අපි දවසක යම් තොරතුරු ටිකක් එකතු කර ගත්තා. තව ප්‍රමාණයක් තියෙනවා ලිපිගොනු බලලා එකතු කර ගන්න. නමුත් අපි ඒ සඳහා අවස්ථාව තියලා නැවත ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් හා තාක්ෂණ නිලධාරීන් සමඟ කැඳවන්න යෝජනා කරන්න කියලා ඉල්ලීම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට දිනයක් මම දෙන්නම්. උදුල මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. එතුමාට සිදුවුණ සිද්ධිය සම්බන්ධයෙන් අපි කණගාටුව පළ කරනවා මේ අවස්ථාවේ සභාවක් විදියට.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි. මට පහුගිය දවසක හදිසි අනතුරක් සිදු වුණා. ඒ සම්බන්ධයෙන් විශේෂ ප්‍රකාශයක් සිදු කිරීමට මම මේ අවස්ථාව යොදා ගන්නවා. ඇත්තටම සිදු වෙච්ච සිදු වීම පිළිබඳව ඉන්දික සිසිර කුමාර මහත්තයාටත්, එතුමාගේ පවුලේ ඥාතීන්ටත් මාගේ හෘදයාංගම කණගාටුව මේ මොහොතේ පුද කර සිටිනවා. මොකද නොසිතූ අනතුරක් සිදු වුණේ. අධිවේගී මාර්ගයේ යන කොට වාහනය නොසිතූ ලෙස අනතුරකට මුහුණ දෙන්න සිදු වුණා. ඒ අවස්ථාවේදී මාත් එක්ක ගමන් කරමින් සිටි ජනාධිපති සම්මාන හය වතාවක් ලබා ගත් ඉන්දික සිසිර කුමාර යන අපේ අති දක්ෂ කලාකරුවා අභාවයට පත් වුණා. ඇත්තටම මට තවමත් ඒ ගැන වේදනාවක් තියෙනවා. මොකද මාත් එක්ක ගමන් කරමින් සිටියේ ඉතාමත් හොඳ කර්තව්‍යයකට. බුදු පිළිමයක් නෙලීම සම්බන්ධයෙන් කොටයක් ගේන්න තමයි යමින් සිටියේ. අවසන් වරටත් මාත් සමඟ කතා බහ කරමින් ගියා. එයා රියදුරු ආසනයේ අනෙක් පැත්තේ හිටියේ. ආසන පටි නිසි ආකාරව පැළඳගෙන සිටියා නම් එයා අදටත් ජීවතුන් අතර සිටින්න පුලුවන්. ඒක නිසි ආකාරව පැළඳ නොසිටි නිසා තමයි ඒ අනතුරේදී එයාට ජීවිතයෙන් සමු ගන්න සිදු වුණේ. මොකද වැටේ වැදිලා අනතුර සිදු වෙලා ලොරිය පෙරලුනෙත් මගේ පැත්තට. මේ පැත්තට පෙරලෙනකොටත් එයා හිටියේ මගේ වම් පැත්තෙන්. මගේ පපුව පැත්තට තමයි එයා වැටුණේ. එයා එළියට විසි වුණේ නැහැ. නමුත් මිත්‍යා මත බොහොමයක් වේගයෙන් ගමන් කරමින් තිබුණා මිනිසුන් අතර. එයා පාරට වැටිලා, වැටේ වැදිලා, එක එක කතා කියලා තිබුණා. වාහනය ඇතුළේ ඩෑෂ් බෝඩ් එකේ වැදිලා තමයි එයා අනතුරට පත් වුණේ. ඊට පස්සේ එයාව එළියෙන් තිබ්බා ගිලන් රථයක් එනකම්. ක්ෂණිකව ඒ සියලු දේවල් සිදු වුණා. ඒ අවස්ථාවේ සිට මගේ සහෝදර මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්, ගරු සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සියලුම නිලධාරීන් හා නිලධාරිනියන් මා වෙනුවෙන් ඉතාමත් දුකට පත් වුණා. ඇත්තටම අගය කරනවා. සහෝදර මන්ත්‍රීවරයෙක් විපතට පත් වුණ අවස්ථාවේදී ක්‍රියා කළාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආරංචිය ගියේ වෙන විදියකටනේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මෙහෙට මුලින් ආරංචිය ආවේ මම මිය ගියා කියලා. අපේ ලියනගේ මන්ත්‍රීතුමා විහිළුවකුත් කරලා තිබුණා මිස්ලා අඬන කොට ''ගැහැණු හඬයි උදුල මන්ත්‍රීතුමා නිහඬයි'' කියලා. අපේ ආදරණීය මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මිස්ලා ගැන හිතලා නෙමෙයි කිවුවේ. ඒක වෙන පැත්තකට හරවනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම හිතන්නේ හැමෝම කණගාටුව ප්‍රකාශ කරා. දූරකථනයෙන් මම හිතන්නේ කිසිම කෙනෙක් සම්බන්ධ වුණේ නැහැ අපේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියෝ. අපේ කාංචනා මන්ත්‍රීතුමිය මළ ගෙදරදි හම්බවුණා. ගරු සභාපතිතුමා හම්බවුණා. ඒ දෙන්නා විතරයි මට මේ අවස්ථාව වනතුරු හම්බවුණේ මම හිතන්නේ මේ සිද්ධියේදී. ඉතින් මම මගේ කණගාටුව ප්‍රකාශ කරනවා නැවත වරක් ඉන්දික සිසිරකුමාර මහත්මයාටත් එතුමාගේ පවුලේ ඥාතීන්ටත්, ඒ ආදරණීය බිරිඳටත්, දරු දෙදෙනාටත් මේ සිදුවීම සම්බන්ධයෙන්.

ඒ වගේම මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා එතුමාගේ බිරිඳට රැකියා අවස්ථාවක් පුලුවන් නම් ලබා දෙන්න කියලා ඉන්න අසරණ තත්ත්වයත් එක්ක.

ඒ වගේම මතක් කරන්න ඕන කොළඹ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ බුදු පිළිමයක් නෙලන කටයුත්තකට ගියේ. ඒ හාමුදුරුවරු ඇවිල්ලා හොයලා බලලා ඒ කටයුතු සිදු කරා. ඒ වනවිට මරණයේ අවසන් කටයුතු සිදු කිරීම සඳහා රු.45,000.00ක මුදලක් ලබාදීලා තිබුණා. ඒ මරණයේ අවසන් කටයුතු සියල්ල සිදුකරේ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ මැදිහත්වීම මත. ඒ වගේම බුදු පිළිමය නෙලන්න රු.50,000.00ක අත්තිකාරම් මුදලක් ලබා දුන්නා. ඒක අපිට දුන්නත් ඒක ආපහු පරිත්‍යාග කරා ඒ වැඩ කටයුතු වලට ගන්න කියලා ඒ මුදල. ඒ වගේම තව රු.25,000.00ක මුදලක් දානමය කටයුතු සඳහා යොදවන්න කියලා ලබා දුන්නා. ඒ වගේම දරුවාගේ අනාගතය වෙනුවෙන් විපස්සනා භාවනා මධ්‍යස්ථානය මාසිකව රු.10,000.00 ක ශිෂ්‍යාධාරයක් ලබා දෙන්න පොරොන්දු වුණා. ඒ වගේම ගේ හදලා දෙන්න පොරොන්දු වෙලා තිබුණා. ඇස්තමේන්තුවක් අරගෙන තිබුණා රු.1,000,000.00ක හෝ රු.2,000,000.00ක ගෙදර ඉතිරි වැඩ කටයුතු ටික සිදු කරන්න. ඒ වගේම රු.3,500,000.00ක මුදලක් යනවා ඒ දරුවාගේ තොල සම්බන්ධයෙන් කරන සැත්කමට. ඒ සම්බන්ධයෙන් විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ හාමුදුරුවෝ පොරොන්දු වෙලා තිබුණා ඒ සියලු කටයුතු කොළඹ ගෙනිහින් කරන්න. ඉදිරියටත් පුලුවන් ආකාරයෙන් දායක වෙන්න පොරොන්දු වුණා. ඉතින් මම හිතනවා අපේ සභාව පැත්තෙන් දෙයක් කරන්න පුලුවන් නම් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා එයාලා වෙනුවෙන් යම් දෙයක් කරන්න කියලා.

ඒ වගේම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕන ගරු සභාපතිතුමාට මේ මිත්‍යා මත වේගයෙන් පැතිර යන අවස්ථාවේදී අවමංගල්‍ය සභාවේදී ඇත්තටම මිනිස්සු අතර විවිධ මත ඉදිරිපත් වෙලා තිබුණ ඒ අවස්ථාවේදී ඔබතුමා මම හිතන්නේ සහෝදර මන්ත්‍රීවරයෙක් හැටියට මම ගැන ප්‍රකාශ කරලා තිබුණා. ඒ වගේම චානක මාදුගොඩ මන්ත්‍රීතුමත් මම ගැන ප්‍රකාශ කරලා තිබුණා. ඒක මම විශේෂයෙන්ම අගය කරනවා. මිත්‍යා මත පැතිරයමින් පවතින වෙලාවක පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවරයෙක් විපතට පත්වුණ වෙලාවේදී ඒ මන්ත්‍රීවරයාගේ නියම ස්වරූපය ඉදිරිපත් කිරීම සම්බන්ධව. මිනිස්සු හිතුවේ මම මරන්න අරන් ගියා කියලා. එක එක කතා කියලා තිබුණා. නොයෙක් මති මතාන්තර කියලා තිබුණා. සමහරු කියලා තිබුණා මම මත්පැන් පානය කරලා වාහනය එලෙව්වා කියලා. ඇත්තටම මම හිතන්නේ වෛද්‍ය පරීක්ෂණයේදී තහවුරු වුණා ඒක. මම මත්පැන් පානය කරන කෙනෙක් නෙමෙයි. ඒ හින්දා ඒක තහවුරු වෙලා තියෙනවා. ඒක ආපහු පුන පුනා කියන්න අවශ්‍ය නැහැ. සමහරු කියලා තිබුණා මට බර වාහන ලයිෂන් නැහැ කියලා. මට අවුරුදු 20ක බර වාහන ලයිෂන් එකක් තියෙන්නේ. ලොරි, බස්, කාර් ඕන එකක් ඇත්තටම මට පදවන්න පුලුවන්. එතනදිත් මිත්‍යා මත පතුරවලා තිබුණා. මෙයාට බර වාහන ලයිෂන් එකක් නැහැ කොහොමද එහෙම ගෙනියන්නේ කියලා. සමහරු දන්නෙත් නැතුව ඇති මට බර වාහන පදවන්න පුලුවන් කියලා. ඉතිං කමක් නැහැ කුමන මත දැරුවත්. මට දුක ශ්‍රේෂ්ඨ කලා ශිල්පියෙක් අපෙන් සමුගත්ත එක. ඒක ගැන නැවත වාරයක් මාගේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඉතින් ඒ මොහොතේ සිට මට සහයෝගය දක්වපු සියලු දෙනාටම නැවත වාරයක් මම හිස නමා ආචාර කරනවා.

ඒ වගේම මම මතක් කරන්න කැමතියි අපේ ඉදිරි මැතිවරණයට ඉදිරිපත්වන ශ්‍යාමිකා අතුකෝරළ මන්ත්‍රීතුමියටත්, ඒ වගේම හුසේන් කියාස් අපේ සහෝදර මන්ත්‍රීතුමාටත් අපේ සුභාශිංෂන ප්‍රාර්ථනා කරනවා මේ අවස්ථාවේදී ඔවුන්ගේ ඉදිරි මැතිවරණ කටයුතු සර්ව ප්‍රකාරයෙන් සාර්ථක වෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, උදුල මන්ත්‍රීතුමා කතා කරපු සිද්ධියේ පණිවිඩය මෙහෙට ලබා දුන්නේ මම. මම ඒ පණිවිඩය ලබාදීමට හේතුව පොඩ්ඩක් මෙතන පැහැදිලි කරොත් හොඳයි කියලා හිතනවා.

ඔය සිද්ධිය උදේ පාන්දරම මට ආරංචි වුණා මම රමේෂ් මැතිතුමාගේ ගෙදර ඉන්නකොට. පොලීසියේ පොලිස් නිලධාරියෙක් මෙහෙට කතා කරලා කිව්වා මෙන්න මෙහෙම මන්ත්‍රීතුමාට කරදරයක් වෙලා කියලා. ඊට පස්සේ මම ඒ ගැන කතා නොකර හිටියා. ඊට පස්සේ ත්‍රීරෝද රථ රියදුරු සරත් මහතා මට කතා කරලා කිව්වා මෙන්න මෙහෙම ආරංචියක් තියෙනවා කියලා. එයත් කිව්වා කාටවත් කියන්න එපා හොයලා බලන්න කියලා. ඊට විනාඩි විස්සකට විතර පස්සේ. ඊට

පස්සේ මට හිරිඹුර ත්‍රීරෝද රථ රියදුරෙක් කතා කරලා කිව්වා මෙහෙමයි උදුල මන්ත්‍රීතුමාට මෙහෙම සිද්ධියක් වෙලා කියලා. ඒත් මම කතා නොකර හිටියා. ඊට පස්සේ දිගින් දිගටම දුරකථන ඇමතුම් එන්න ගත්තම හෙවුවේ නැති වුණාමත් හොඳ නැති නිසා මම මුල් ආරංචිය ඇවිල්ලා පැය එක හමාරකට විතර පස්සේ මම විජය ලක්ෂ්මී අපේ ග්‍රාම සේවකතුමියට කතා කරා. කතා කරලා මම ඇහුවා මෙන්න මෙහෙම සිද්ධියක ආරංචියක් යනවා මොකක්ද කියලා හොයලා බලලා හාමුදුරුවන්ට කතා කරලා මට කියන්න කිව්වා. එයා ඉන්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කිව්වා. හරි අහලා කියන්නම් කිව්වා. ඊට පස්සේ මට එහෙම කියපු අතරතුර කරාපිටියේ පන්සලට ගියා. පන්සලට යනකොට පැල්පොලවත්ත පහුවෙනකොට ආයේ දුරකථන ඇමතුමක් ආවා විජය ලක්ෂ්මී ග්‍රාම නිලධාරිතුමියගෙන්. සිද්ධිය හරි කිව්වා. එයා හාමුදුරුවන්ට කතා කරා කිව්වා. හාමුදුරුවෝ දැන් යන ගමන් කියලා එයාට කිව්වා කියලා. මම එවෙලේ පන්සලට ගියේ නැහැ. සභාපතිතුමාට දුරකථනයෙන් ඇමතුමක් අරගෙන කිව්වා මෙහෙම සිද්ධියක් වෙලා තියෙනවා කියලා. අන්න ඒක තමයි සිද්ධවුණේ. අන්තිමට සභාපතිතුමා මෙහෙන් සිද්ධිය හොයලා නිවරදි කරානේ. නිවරදි කරපු වෙලාවේ මම විහිළුවට තමයි අර ප්‍රකාශය කිව්වේ අපි බැනර් එකක් ගහමු කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි බොහොම ස්තුතියි. සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරනවා. මීළඟ මහා සභා රැස්වීම සිංහල දෙමළ අලුත් අවුරුද්දට කලින් තියන්න ඕන. අප්‍රේල් 09 වෙනිදා තමයි අපි සභා රැස්වීම තියන්න යෝජනා කරගෙන ඉන්නේ. මොකක් හරි විශේෂ තත්ත්වයක් ඇති නොවුණොත් අප්‍රේල් 09 වෙනිදා මහා සභා රැස්වීම පැවැත්වෙනවා.

**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

මීළඟ මහා සභා රැස්වීම 2020.04.09 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.